# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## වාර්ෂික වාර්තාව

# 2010

# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ

# සභාපතිතුමාගේ පණිවුඩය



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2010 වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මාගේ සතුට ප්‍රකාශ කරමි. පාරිභෝගික ආරක්ෂණය හා යහපත් තරගකාරිත්වයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා අධිකාරිය විසින් මෙම වසර තුළදී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලද අතර. මෙම වැඩසටහන් අධිකාරියෙහි දැක්ම වන "සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ සුරක්ෂිත වූ පාරිභෝගිකයකු බිහිකිරීම " යන්න ඉලක්ක කොට ගෙන ක්‍රියාත්මක කරන ලදි.

2010 වසරේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටා ඇති දිස්ත්‍රික් ඒකක ශක්තිමත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් නව විමර්ශන නිලධාරින් කණ්ඩායමක් බඳවා ගන්නා ලදි. දිස්ත්‍රික් ඒකක සඳහා අවශ්‍ය සම්පත් ලබාදීම සඳහා ද පියවර ගෙන ඇත. දිස්ත්‍රික් ඒකක සඳහා ඉලක්ක ගත ක්‍රියාකාරී සැලැස්මක් සකසා ඇති අතර, පුද්ගල හා කණ්ඩායම් ක්‍රියාකාරිත්වය ඇගයීම ද නිරන්තරයෙන් සිදුකරන ලදි. මෙම වැඩසටහන හඳුන්වාදීම තුළින් විශේෂයෙන්ම වෙළෙඳපොල විමර්ශන හා වැටලීම් පිළිබඳ විශිෂ්ට ප්‍රගතියක් ලබාගැනීමට අධිකාරියට හැකි විය .

2010 වසරේ පාරිභෝගික අයිතිවාසිකම් දිනයේ තේමාව වූයේ "අපේ මුදල් අපි සුරකිමු" යන්නයි. පාරිභෝගික අයිතිවාසිකම් දිනය මුල්කොටගෙන පාරිභෝගික අයිතිවාසිකම් හා යුතුකම්, පාරිභෝගික හිමිකම් සුරැකීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සපයන සේවා, මහජනයාට අධිකාරියෙන් සේවා ලබා ගත හැකි ආකාර, අධිකාරියේ ජයග්‍රහණ, සහ පාරිභෝගික අයිතිවාසිකම් දින තේමාව සම්බන්ධ ලිපි ඇතුළත් කොට පුවත්පත් අතිරේකයක් පළ කිරීමට පියවර ගන්නා ලදි. රටපුරා විසිරි ඇති පාරිභෝගිකයන් විශාල සංඛ්‍යාවකට තොරතුරු බෙදාහැරීමට අධිකාරියට මෙමගින් හැකිවිය.

වෙළෙඳපොල තොරතුරු නිවැරදිව හා කලට වේලාවට ලබාගැනීම සඳහා වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය පිහිටුවන ලදි. අත්‍යාවශ්‍ය භාණ්ඩ සම්බන්ධ තීරණවලට එළඹීමේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රේඛීය අමාත්‍යාංශය, ආහාර සුරක්ෂිතතා ,ජීවන වියදම් කමිටුව මෙම තොරතුරු භාවිතයට ගනී.

2010 දී ජාතික රක්ෂණ භාර අරමුදලෙන් සේවක මණ්ඩලය සඳහා වෛද්‍ය සහ සහ කම්කරු වන්දි ආවරණය හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදි.

මෙම ජයග්‍රහණයන් ලබාගැනීම සඳහා උරදුන් අධ්‍යක්ෂ මණ්ඩලයට හා සේවක මණ්ඩලයට මාගේ ස්තුතිය පුදකරමි.

අපගේ මෙම සියලු වැඩසටහන් සඳහා දූරදර්ශී නායකත්වය සහ මග පෙන්වීම ලබා දුන් සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම් සුනිල් එස්. සිරිසේන මහතාටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

රූමි මර්ෂූක්
සභාපති
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

## අපගේ දැක්ම

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහිකිරීම

## අපගේ මෙහෙවර

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළෙඳාම විධිමත් කිරීම සහ යහපත් තරගකාරීත්ව ප්‍රවර්ධනය කිරීම තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

## අපගේ ඒකාබද්ධ ඉලක්කයන්

- වෙළෙඳපොල නියාමනය කිරිම මගින් අමන්දානන්දනයට පත්වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.
- අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පීඩාවට පත් පාරිභෝගිකයන්ට සහන සැලසීම.
- පාරිභෝගික අධ්‍යාපනය සහ පාරිභෝගිකයා සවිබලගැන්වීම.
- තරග විරෝධි වෙළෙඳ චර්යාවන්ගෙන් නිෂ්පාදකයා හා වෙළෙඳුන් ආරක්ෂා කිරීම සහ වඩාත් හිතකර තරගකාරී වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම.
- හැකියාවන් වැඩි දියුණු කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළගාකර ගැනීම.

## අපගේ ආයතනික සාරධර්ම

**විශ්වාසදායි බව**

කාර්යසාධන අනුකූලතාව පවත්වාගැනීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම.

**අවංකත්වය සහ ඒකීයත්වය**

සියලුම කාර්යන්හිදී අවංකවීම, සාධාරණ වීම සහ යුක්තිගරුක වීම.

**වගකිවයුතු බව**

විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතු බව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම.

**කණ්ඩායම් හැඟීම**

අන්‍යෝන්‍යය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීබව වර්ධනය කරමින් පොදු ඉලක්කයන් ළගාකර ගැනීම උදෙසා සියලුම සේවකයන් එක්ව කටයුතු කිරීම.

**පිළිගැනීම**

සේවකයින්ගේ විශිෂ්ඨ කාර්යඵල අගය කිරීම හා ප්‍රශංසා කිරීම.

**කැපවීම**

පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටු කිරීම.

**ප්‍රතිචාර දැක්වීම**

සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම.

**නිර්මාණශීලී බව සහ නව්‍යතාවයන් දිරිගැන්වීම**

සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා නව අදහස් උත්පාදනය කිරීම.

2 වන මහළ

සතොස ලේකම් කාර්යාල ගොඩනැගිල්ල

අංක 27, වොක්ෂෝල් වීදිය

කොළඹ 02

2011.12.09

ගරු සමූපකාර සහ අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා වෙත,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර 2010 වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාව සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

ඔබේ විශ්වාසී,



රුමි මර්ෂුක්
**සභාපති**
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## වාර්ෂික වාර්තාව - 2010


පටුන පිටු අංක

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ---------------------------------- 8

1.1 හැඳින්වීම ------------------------------------------------ 8

1.2 අධිකාරියේ සංයුතිය ---------------------------------------- 8 - 9

1.3 අධිකාරියේ සේවක මණ්ඩලය -------------------------------- 10

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව ---------------------------- 11

2. අප ආයතනයේ අරමුණු ----------------------------------------------- 12

3. අපගේ කාර්ය භාරය ------------------------------------------------ 13 - 14

4. විශේෂ ව්‍යාපෘති / වැඩ සටහන් - 2010 -------------------------------- 15

5. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හාපාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්ය සාධනය - 2010 ------------------------------------------- 16 - 28

6. 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන ----------------- 29

7. 2010 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන --- 30

8. 2010 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන --------- 31 - 37

9. 2010 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා විගණකාධිපතිගේ වාර්තාව ----- 38 - 45

10. විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස් දැක්වීම -------- 46 - 51

# 1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## 1:1 හැඳින්වීම

1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත සහ 1987 අංක 1 දරණ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත (173 වන අධිකාරය වූ) අහෝසි කරමින් 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය පිහිටුවන ලදි.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළෙඳාම සහ භාණ්ඩ හා සේවා මිළ ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වෙළෙඳ පිලිවෙත් වලට එරෙහිව වෙළෙඳුන් සහ සාදන්නන් ආරක්ෂා කිරීමයි. තවද, හැකිසෑම අවස්ථාවකදීම තරගකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙන්ඳන් හා සාදන්නන් අතර යහපත් තරගයක් පවත්වාගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරියේ සංයුතිය

පනතේ විධිවිධාන ප්‍රකාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සහ පනතේ නිශ්චිත වශයෙන් සඳහන්කර ඇති සුදුසුකම් හා පලපුරුද්දලත් සභාපතිවරයෙකුගෙන් සහ තවත් සාමාජිකයන් 10 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් අධිකාරිය සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයන් -2010**

2010 මැයි මස වන තුරු අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| රුමි මර්ෂුක් මහතා | - | සභාපති |
| හේමලාල් තල්ගස්වත්ත මහතා | - | විධායක අධ්‍යක්ෂක |
| ශිරාණි වේරගොඩ මිය | - | විධායක අධ්‍යක්ෂක |
| ජේ.ඒ.යසරත්න මහතා | - | විධායක අධ්‍යක්ෂක |

ටී.එම්. සංසදාස මහතා

රාජේස් නෝනිස් මිය

මහාචාර්යය ඩබ්.එම්. වික්‍රමාරච්චි

සී.යූ.ජේ.කේ.කේ. කුලතිලක මහතා

එස්.ඒ.කේ.දිසානායක මහතා

පී.ඒ. පියදාස මහතා

මංජුල මාකුඹුර මහතා

වෛද්‍ය ජයන්ත බලවර්ධන

ඩී.එච්.බී. එදිරිසිංහ මහතා

පී.ඩී.එම්. කුසුමලතා මිය

වෛද්‍ය එල්.පී.ඒ. කරුණාතිලක

අචාර්යය අජන්තා පෙරේරා මිය

එස්.මෙරික් ගුණරත්න මහතා

සිරිපාල අමරසිංහ මහතා

වෛද්‍ය අර්ජුන ද සිල්වා

එස්.කිත්සිරිමෙවන් ලංකාතිලක මහතා

2010.05.31 වන දින සිට නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් වූ අතර රූමි මර්ෂුක් මහතා 2010.10.12 වන දින සිට දෙවන වරට සභාපති ධූරය සඳහා නැවත පත්වන ලදි.

| | | |
|---|---|---|
| රූමි මර්ෂුක් මහතා | - | සභාපති |
| මිල්ටන් අමරසිංහ මහතා | - | විධායක අධ්‍යක්ෂක |
| සුනිල් ජයවීර මහතා | - | විධායක අධ්‍යක්ෂක |
| මේජර් ජෙනරාල් පී.චන්ද්‍රවංශ | - | විධායක අධ්‍යක්ෂක |
| පූජ්‍ය රැකව පීනරතන හිමි | | |
| චන්ද්‍රා ඒකනායක මෙය | - | භාණ්ඩාගාර නියෝජිත |
| පී.මායාදුන්නේ මහතා | - | අමාත්‍යාංශ නියෝජිත - 2010 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් විය. |

සුගත් මොහාන් ෆ්‍රෑන්ක් ද සිල්වා මහතා

දූෂාන් සෝසා මහතා

විනෝද් දන්සිංගනි මහතා

හනිෆ් යූසුෆ් මහතා

ජේ.එම්. ජයතිලක ජයසුන්දර මහතා

වරුණ අලව්ව මහතා

අනුර ප්‍රනාන්දු මහතා

අනිල් කුමාර සේනාධීර මහතා

ජේ.වී.කේ. ජයසූරිය මහතා - 2010 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් විය.

බැසිල් වැලන්ගන්බර්ග් මහතා

ඩබ්.ඒ.සී. හේමකුමාර මහතා

ආර්.බී. තෙන්නකෝන් මහතා

මේජර් වයි.එච්.පී.එන්.වයි. සේනාධිපති

එම්.බී.එම්. ඉබ්‍රාහිම් මහතා

එච්.එම්.එල්.එච්. බණ්ඩාර හේරත් මහතා

මාධව සංජීව වත්තේගම මහතා

වෛද්‍ය ජයන්ත බලවර්ධන

මේජර් විජිත වැලිකල - 2010 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් විය.

**1:3. අධිකාරියේ සේවක මණ්ඩලය**

රූමි මර්ෂුක් මහතා සභාපතිවරයා ලෙස 2010 වර්ෂය තුළදී අඛණ්ඩව සේවය කරන ලදි. රන්මිණි ජයසූරිය මහත්මිය නැවතත් 2009.03.02 වන දින සිට වසරක පරිවාස කාලයකට යටත්ව අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්කල අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව 2010.02.18 වන දින සේවයෙන් ඉවත් කරන ලදි. මින් පසු පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශයේ අධ්‍යක්ෂිකා චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වරිය ලෙස 2010.02.25 වන දින සිට පත් කරන ලදි.

**අධිකාරියෙහි අංශ භාර ප්‍රධානින්**

දීප්ති තිසේරා මිය - අධ්‍යක්ෂිකා (අනුකූලවීම් සහ බලගැන්වීම්)

[M.PA.(PIM-Sri J), Attorney –at-Law]

චන්ද්‍රිකා තිලකරත්න මිය - අධ්‍යක්ෂිකා (පාරිභෝගික කටයුතු හා තොරතුරු)

[B.Sc.Agri (Sp), M.Sc, (Mgt) ]

ශාන්තිනී තිරුනීලකන්දන් මිය - අධ්‍යක්ෂිකා (තරගකාරිත්ව ප්‍රවර්ධන)

[ ACEA]

ඩබ්.එම්.ප්‍රියන්ත මහතා - අධ්‍යක්ෂ (මුදල්)

[ MPM, B.Com.(Sp), AIPFM, DPFM ]

සම්පත් අගුළුගහ මහතා - අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)

[ B.Com.(Sp) Hons, AIPM (SL), Dip. in PM ]

2010.02.22 වන දින අධ්‍යක්ෂක - මානව සම්පත් හා පරිපාලන තනතුර සඳහා සම්පත් අගුළුගහ මහතා පත්වන තුරු එම්.පී.ඩී. මැදවත්ත මහතා විසින් එම තනතුරෙහි රාජකාරීන් ඉටුකරන ලදි .

2010 වසරේදී ද රොහාන් මීවනගේ මහතා අධ්‍යක්ෂ (මිල කිරීම් හා කළමණාකරන) තනතුරෙහි රාජකාරීන් ඉටු කිරීම සිදුකරන ලදි.

**1:4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව**

පනතේ iv වන කොටසේ විධිවිධාන ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවා ඇත. 2010 මැයි මස වනතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සභාපති ලෙස උපාලි සේනාරත්න මහතා ද සාමාජික ලෙස දිලුම් ඩී ආබෲ මහතා සහ මහාචාර්යය පී.විල්සන් යන අයද ක්‍රියාකරන ලදි. පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සභාපති ලෙස උපාලි සේනාරත්න මහතා 2010.05.20 වන දින සිට නැවත පත්වන ලදි. පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකත්වය සඳහා නව සාමාජිකයන් දෙදෙනෙකු 2010.05.31 දින සිට පත්වන ලදි.

**පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයන් - 2010**

| | | |
|---|---|---|
| උපාලි සේනාරත්න මහතා | - | සභාපති |
| වසන්ත ගුණවර්ධන මහතා | - | සාමාජික |
| සුදත් විජේවික්‍රම මහතා | - | සාමාජික |
| සභාවේ ලේකම් | - | ලේඛා ආර්යරත්න මෙය (Attorney –at-Law) |

# 2.අප ආයතනයේ අරමුණු

## 2.අධිකාරියේ අරමුණු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ප්‍රකාරව අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

- පාරිභෝගිකයාගේ ජීවිත සහ දේපළ වලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළෙඳ පිලිවෙත් වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැකිවීමට සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීම සහතික වීම.
- අසාධාරණ වෙළෙඳ පිලිවෙත් සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්ඳන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම.

## 3. අපගේ කාර්යයභාරය

<u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

අධිකාරියේ කර්තව්‍යය පහත පරිදි විදහා දැක්විය හැකිය.

අ) i. ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම්

ii. ව්‍යවසායන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල්

iii. වෙළෙඳපොල ඇතුළත හෝ වෙළෙඳපොලේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙෂ යොදා ගැනීම හෝ

iv. දේශීය හෝ ජාත්‍යන්තර වෙළඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරගකාරිත්වය පිළිබඳ යම් අවහිරයක් පාලනය කිරීම හෝ ඉවත් කිරීම.

ආ) තරග විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ කිරීම.

ඇ) භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායි තරගකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගත හැකිවීම සහ ඒවායෙහි තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, මිලදී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

ඉ) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම.

ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.

උ) වෙළෙඳපොල තරගකාරීත්වය අඩු ඵලදායිතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරගකාරී මිල ප්‍රවර්ධනය කිරීම.

ඌ) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යනය භාරගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම.

එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව, සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

ඔ) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමග හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම.

ඕ) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම.

ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම.

ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත් කිරීම, සහ

ච) අධිකාරියේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු කිරීම.

## 4.විශේෂ ව්‍යාපෘති / වැඩ සටහන් -2010

2010 වසර තුළ දී අධිකාරිය මගින් ඉටු කරනු ලබන සේවාවන්හි ගුණාත්වය වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති / වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

- **දිස්ත්‍රික් කාර්යාල ශක්තිමත් කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ආශ්‍රිතව අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු වැඩිදියුණු කිරීම කෙරෙහි 2010 වසරේ දී විශේෂ අවධානයක් යොමු විය.මෙම දිස්ත්‍රික් කාර්යාලවල කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව විමර්ශන නිලධාරින් 64 දෙනෙකු බඳවා ගැනීමට අධිකාරියට හැකි විය.මෙසේ බඳවා ගත් නිලධාරින් උදෙසා ඔවුන්ගේ සේවයට අදාළව දිස්ත්‍රික් කාර්යාලවල දි ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳව සති 2 ක පමණ පුහුණුවක් ලබා දෙන ලදි.

එමෙන්ම දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරින්ට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදි. දිස්ත්‍රික් නිලධාරින්ට ජංගම දුරකථන ලබා දිම, පැක්ස් යන්ත්‍ර හා පරිගණක යන්ත්‍ර ලබා දීම, මේ අතර වේ.එමෙන්ම වැටලීම් නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම් සලසා දීමත් , වෙළෙඳපොල වැටලීම් සඳහා අවශ්‍ය උපාය දූත මුදල් සීමාවන් ඉහළ නැංවීම ද සිදුකරන ලදි.

- **පාරිභෝගික අයිතිවාසිකම් දිනය-2010**

පාරිභෝගික අයිතිවාසිකම් දිනය වෙනුවෙන් පාරිභෝගික ජාත්‍යන්තරය විසින් "අපේ මුදල් අපි සුරකිමු " යන තේමාව ප්‍රසිද්ධියට පත් කරන ලද අතර මෙම තේමාව මුල් කර ගනිමින් පුවත්පත් අතිරේකයක් පළ කිරීමට ක්‍රියා කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් හා යුතුකම් , පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා අධිකාරිය ගත් ක්‍රියා මාර්ග , අධිකාරියේ ප්‍රධාන ඉලක්කයන් සහ ඒවා ළගා කර ගත් ආකාරය කෙසේ ද යන්න පිළිබඳ කරුණු මෙහි අන්තර්ගත විය. අධිකාරියට සිංහල, දෙමළ, ඉංග්‍රිසි මාධ්‍යයන් ඔස්සේ බොහෝ සිරිසක් දැනුවත් කිරීමට මෙමගින් හැකි විය.

- **වෙළෙඳපොල දත්ත පද්ධතිය හා පර්යේෂණ ඒකකය පිහිටුවීම.**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් වන්නේ තීරණ ගැනීම සඳහා අවශ්‍යවන නිවැරදි හා යාවත්කාලීන තොරතුරුවල ඌනතාවයයි. මෙයට පිළියමක් ලෙස මෙම ක්ෂේත්‍රයෙහි ප්‍රවීනතා තිබෙන විමර්ශන නිලධාරින් කිහිපදෙනෙක් යොදවාගෙන වෙළෙඳපොල තොරතුරු පද්ධතිය ස්ථාපිත කරන ලදි. මෙම ඒකකය විසින් අත්‍යාවශ්‍ය භාණ්ඩවල දත්ත පැතිකඩ සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා රේගුව, හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂිකාර්මික පර්යේෂණ හා පුහුණු ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ආර්ථික මධ්‍යස්ථාන, සතොස සුපිරි වෙළෙඳසැල් ජාලය හා අනෙකුත් සිල්ලර වෙළෙඳුන්ගෙන් එක්රැස්කරනු ලැබේ. අත්‍යාවශ්‍ය භාණ්ඩ පිළිබඳව තීරණ ගැනීමේදී දත්ත පරිගණක ගත කොට විශ්ලේෂණය කරන ලද තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රේඛීය අමාත්‍යාංශය ආහාර සුරක්ෂිතතාව හා ජීවන වියදම පිළිබඳ කමිටුව මගින් ප්‍රයෝජනයට ගනු ලැබේ.

**සේවක මණ්ඩල සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.**

ජාතික රක්ෂණ භාර අරමුදල මගින් සේවක මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණ ආවරණයක් සහ කම්කරු වන්දි ආවරණයක් ලබා දීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කරන ලදි.

## 5. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ කාර්යය සාධනය

ආයතනික ව්‍යුහයට අනුව අධ්‍යක්ෂකවරුන් 06 දෙනෙකු යටතේ ක්‍රියාත්මකවන අංශ 6 කින් අධිකාරිය සමන්විත වේ. මෙම අංශයන්, පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය, අනුකූලවීම් හා බලගැන්වීම් අංශය, මිළකරණ හා කළමණාකරන අංශය, තරගකාරිත්ව ප්‍රවර්ධන අංශය, මානව සම්පත් හා පරිපාලන අංශය, මූල්‍ය අංශය ලෙස නම් කොට ඇත.

2010 වර්ෂය තුලදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යය සාධනය පහත සඳහන් පරිදි වේ.

1. <u>උපද්‍රවකාරී හා ප්‍රමිතියෙන් තොර භාණ්ඩ අලෙවි කිරීමට හා සේවාවන් සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.</u>

**(අ) භාණ්ඩවල ගුණාත්වය තහවුරු කිරීම සඳහා තෝරාගත් භාණ්ඩවලට අදාළ ප්‍රමිති අනිවාර්යය කිරීම.**

වෙළෙඳපොල තුල පවතින භාණ්ඩවල ගුණාත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් පනතේ ප්‍රතිපාදන යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් ශ්‍රී ලංකා ප්‍රමිතිය අනිවාර්යය කරමින් මේ යටතේ දේශීයව නිෂ්පාදනය කරනු ලබන දත්බුරුසු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත්කරනු ලබන S L S භාණ්ඩ සහතික ලාංඡනය සඳහන් කිරීම අනිවාර්යය කොට ඇත.

මෙම විධානයට අනුව නිෂ්පාදකයන්, බෙදාහරින්නන් සහ වෙළෙඳුන් විසින් දේශීයව නිෂ්පාදිත දත් බුරුසු නිෂ්පාදනයේදී බෙදාහැරීමේදී, ගබඩා කිරීමේදී, හෝ විකිණීමට ඉදිරිපත් කිරීමේදී S L S භාණ්ඩ සහතික ලාංඡනය අනිවාර්යය වේ.

**(ආ)ප්‍රමිතියෙන් තොර ආනයනික භාණ්ඩ අධීක්ෂණය කිරීම.**

ප්‍රමිතියෙන් තොර භාණ්ඩ රටතුලට ඇතුළු වීම වැලැක් වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට පියවර ගන්නා ලදි. එවැනි අවස්ථා 92 ක් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදුකළ අතර ආනයන සුපරීක්ෂණ වැඩසටහන් යටතේ එම භාන්ඩ ප්‍රතිඅපනයනය කරන ලෙස නිර්දේශ කරන ලදි.

**(ඇ)ජාතික කමිටු නියෝජනය කිරීම සහ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති / ව්‍යවස්ථා හඳුන්වා සඳහා දායක වීම**

- ආහාර උපදේශන කමිටුව
- ජාතික කොඩෙක්ස් කමිටුව
- විලවුන් ඇගැයීම් කමිටුව
- මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ රිති සංග්‍රහය ක්‍රියාවට නැංවීමේ කමිටුව.

## 2 ප්‍රයෝගාත්මක සහ අසාධාරණ වෙළෙඳ චර්යාවන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම

### (අ)ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ විධි විධාන ප්‍රකාර අනුකූලතාවක් දැක්විය යුතු නීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පියවර ගෙන ඇති අතර සාධාරණ ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යෑම සඳහා වෙළෙඳ ප්‍රජාවට සහය දක්වා ඇත. අධිකාරිය විසින් වාණිජ මණ්ඩල, වෙළෙන්දන්ගේ සංගම් සහ සමාගම් සඳහා පුහුණු වැඩමුළු පවත්වයි. 2010 වර්ෂය තුළදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 99 ක් පවත්වා ඇති අතර වෙළෙඳුන් 3411 ක් මෙම වැඩසටහන් සඳහා සහභාගීවී ඇත.

### (ආ) වෙළෙඳපොල විමර්ශන

වෙළෙඳුන් විසින් සිදුකරනු ලබන අයථා ක්‍රියාමාර්ග ගණනාවක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් හඳුනා ගෙන ඇති අතර පනත විසින් හඳුන්වාදී ඇති එවැනි ක්‍රියාමාර්ග කීපයක් ලෙස ලේබල් කිරීමේ උපදෙස් උල්ලංඝණය කිරීම, සලකුණු කල මිලට වඩා වැඩි වටිනාකමකට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සන්තකයේ තබා ගෙන විකිණීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබා ගැනීම, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය රහිතව නිශ්චිත භාණ්ඩවල සිල්ලර සහ තොග මිල ඉහළ දැමීම, මිල ලැයිස්තු ප්‍රදර්ශනය නොකිරීම, ගැනුම් කරුවන්ට කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමග යවන හෝ රවටන සුළු පැවැත්ම සහ නිෂ්පාදකයින් / වෙළෙඳුන් විසින් සිදුකරනු ලබන අසත්‍ය නියෝජන නම් කළ හැකිය. අධිකාරිය විසින් විධිමත් වෙළෙඳ පොළ විමර්ශනයන් සිදුකරනු ලබන අතර පනතෙහි ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳ පොළ වැටලීම් සිදුකරයි. වැරදි සිදුකරනු ලබන වෙළෙඳුන්ට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පවරන අතර පනතේ 60 වන වගන්තිය මගින් සලසා ඇති විධි විධාන පදනම් කර ගනිමින් දඩ මුදල් පනවනු ලැබේ.

මෙම වර්ෂය තුළ දී අධිකාරිය විසින් වෙළෙඳ පොළ වැටලීම් 10900ක් සිදු කර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහ දිස්ත්‍රික් ඒකකවලට අනුයුක්ත කොට ඇති නිලධාරීන් විසින් මෙම වැටලීම් සිදු කොට ඇත. මෙය පූර්ව වර්ෂයට වඩා 141 % ක ඉහළ යාමකි. 2010 වර්ෂයේ දී පනතේ විධි විධාන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳුන් වෙත පනවා ඇති දඩ මුදල් ප්‍රමාණය රු.මිලියන 28.509 කි. මෙය පසු ගිය වර්ෂයට වඩා 29 % ක ඉහළ යාමකි. වෙළෙඳපොළ වැටලීම් සහ රජයට අය වූ දඩමුදල් වල ප්‍රගතිය පිළිවෙලින් වගු අංක 01 සහ 02 වගු මගින් පෙන්නුම් කෙරේ.

වගු අංක 01-වෙළෙඳ පොළ වැටලීම්වල ප්‍රගතිය




වගු අංක 02- වැටලීම්වලින් ඉපයූ දඩ මුදල් ආදායම



**(ඇ). හඳුනාගත් ආනයනික භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිල ක්‍රියාවට නැංවීම**

රට තුළට ඇතුලුවන භාණ්ඩ වර්ග 5 ක් සඳහා එම අවස්ථාවේදී උපරිම සිල්ලර මිල නියම කිරීම අනවාර්යය කරමින් නිකුත්කල ගැසට් පත්‍රය ක්‍රියාවට නැංවීම නිසා අව ප්‍රමාණයට ඉන්වොයිස් කිරීම වැලකී මෙන් රේගුවට සැලකියයුතු ආදායමක් උපයා ගැනීමට හැකවී ඇත. මෙම වසර තුළ උපරිම සිල්ලර මිල ක්‍රියාවට නැංවීම ගැන අධිකාරියට ඉල්ලුම් 333 ක් ලැබී ඇත.

**3. <u>අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වල බලපෑමට ලක්වූ පාරිභෝගිකයන් සඳහා සහන සැලසීම.</u>**

**(අ) පාරිභෝගික පැමිණිලි සඳහා සහන ලබාදීම.**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 13 වන හා 32 වන වගන්තිවලින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික පැමිණිලි සඳහා අධිකාරිය මැදිහත් වේ. පනතෙහි 12 වන වගන්තියෙන් නියමකර ඇති ප්‍රමිති හා පිරිවිතරයන්ට අනුකූල නොවන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් හා ලබාදුන් වගකීම් හා ප්‍රතිඥාභාරයන් වෙළෙඳුන් විසින් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේ හැකියාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුය.

2010 වසරේ පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේ දී ලබා ඇති ප්‍රගතිය වගු අංක 03 සහ 04 මගින් දැක්වේ.

**වගු අංක 03- 2010 වසරේ පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේ ප්‍රගතිය**

| පාරිභෝගික පැමිණිලි | 2010 |
|---|---|
| ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 1806 |
| වෙනත් ආයතන වෙත යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 178 |
| දිස්ත්‍රික් කාර්යාල වෙත යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 46 |
| අධිකාරියේ වෙනත් අංශ වෙත යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 100 |
| වැටලීම් සඳහා යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 777 |
| අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 476 |
| ප්‍රතික්ෂේප වූ පැමිණිලි සංඛ්‍යාව | 123 |
| සාකච්ඡා පවත්වන ලද පැමිණිලි සංඛ්‍යාව | 350 |

වගු අංක 04 - පාරිභෝගික පැමිණිලි සඳහා පැවැත් වූ විමර්ශනවල ප්‍රගතිය

| විමර්ශන | 2010 |
|---|---|
| විමර්ශන සඳහා නියම කරන ලද පැමිණිලි ගණන | 51 |
| සමථයකට පත් කළ විමර්ශන ගණන | 15 |
| නිකුත් කළ නියෝග ගණන | 10 |
| පැවැත් වූ සාකච්ඡා (විමර්ශනයට පෙර) | 28 |

**4. <u>පාරිභෝගික අධ්‍යාපන සහ සවිබලගැන්වීම</u>**

**අ) පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන්**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය , සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩ සටහන් , ප්‍රදර්ශණ , පාරිභෝගික අයිතිවාසිකම් දින වැඩ සටහන් ආදිය ක්‍රියවට නංවමින් පාරිභෝගික අයිතිවාසිකම් සහ යුතුකම්, වර්තමාන පාරිභෝගික නීති , යහපත් පාරිභෝගික චර්‍යාකම් හා යහපත් වෙළෙඳ ක්‍රියාකාරකම් පළිබඳව පාරිභෝගික හා වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලදි.

පාසැල් ශිෂ්‍යයන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, රාජ්‍ය නිලධාරීන්, පාරිභෝගික කටයුතු පිළිබඳ ක්‍රියාකාරීන්, ගෘහණියන් සහ ශ්‍රී ලාංකීය පොදු ජනතාව යනාදී වශයෙන් විවිධ කණ්ඩායම් මූලික කරගනිමින් පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර 2010 වසර තුළදී එවැනි වැඩසටහන් 301 ක් ක්‍රියාත්මක කිරීමට අධිකාරියට හැකිවිය. එසේම පුවත්පත් දැන්වීම්, ගුවන්විදුලි වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන් සහ අධිකාරියේ නිල වෙබ් අඩවිය මඟින් ද පාරිභෝගික දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. මෙම වැඩසටහන්වලදී පාරිභෝගිකයින් ඔවුන් සතු අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කරන අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවාවන් ලබා ගැනීම සඳහා ඔවුන් විසින් ක්‍රියාත්මක විය යුතු ආකාරය ද පැහැදිළි කරනු ලබයි. තවද පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කර ගැනීම සඳහා සාමූහිකව ක්‍රියා කරමින් පාරිභෝගික සංවිධාන පිහිටුවා ගැනීමේ වැදගත්කමද අවධාරණය කෙරේ. වාණිජ මණ්ඩල සහ වෙළෙඳ සංවිධාන සඳහා වැඩසටහන් මෙහෙයවීම තුළින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය බලාපොරොත්තු වනුයේ වෙළෙඳුන් වෙත පණවා ඇති නීතිරීති පිළිබඳව වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීමයි. 2010 වසරේ දී පාරිභෝගික අධිකාරිය විසින් පවත්වා ඇති එම වැඩසටහන් පිළිබඳ විස්තර වගු අංක 05 මඟින් දක්වා ඇත.

වගු අංක 05 - 2010 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපනික වැඩසටහන් පිළිබඳ තොරතුරු

| වැඩසටහන | 2010 | | |
|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ ප්‍රමාණය | පාරිභෝගික සංවිධාන හෝ පාසැල් පාරිභෝගික කමිටු සංඛ්‍යාව |
| මහජන දැනුවත් කිරීම් | 83 | 24280 | - |
| පාසල් සිසුන් දැනුවත් කිරීම් | 100 | 11391 | - |
| වෙළෙඳ දැනුවත් කිරීම් | 99 | 3411 | - |
| පාරිභෝගික සංවිධාන පිහිටුවීම | | 1007 | 24 |
| මාධ්‍ය මගින් දැනුවත් කිරීම් (මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය පුවත් නිවේදන හා දැන්වීම් ) | 11 | - | - |
| ප්‍රදර්ශන පැවැත්වීම | 08 | 129000 | - |
| **එකතුව** | **301** | **169089** | |

**දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් :**

**2010 / 2011-මොනරාගල**

පහත සඳහන් වැඩසටහන්වලින් සමන්විත විශේෂ දැනුවත් කිරීමේ ව්‍යාපෘතියක් මොණරාගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලදි.

- රාජ්‍ය ආයතන හා පාසැල් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන්
- ආදර්ශමත් වෙළෙඳසැළ තේරීමේ තරඟය ක්‍රියාත්මක කිරීම
- පාරිභෝගික සංවිධාන හා පාසැල් පාරිභෝගික කමිටු පිහිටුවීම
- දැයට කිරුළ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම

**(ආ) දැනුවත් කිරීමේ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම**

මෙම වසර තුදී අධිකාරිය විසින් දැන්වත් කිරිමේ අත් පත්‍රිකා සිංහල , දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන් මගින් ප්‍රකාශයට පත් කරන ලදි.

**(ඇ)පාරිභෝගික සංවිධාන පිහිටුවීම**

2010 වසර තුළ දී පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය උදෙසා පාරිභෝගික අධිකාරිය විසින් ක්‍රියා මාර්ග ගන්නා ලද අතර පාරිභෝගිකයන් 1007ක ගේ සහභාගීත්වයෙන් පාරිභෝගික සංවිධාන 24 ක් පිහිටුවීමට හැකිවිය.

**5. <u>තරග විරෝධි චර්යාවන්ගෙන් වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සහ යහපත් තරගකාරීත්වයක් ප්‍රවර්ධනය කිරීම</u>**

තරඟකාරීත්ව ප්‍රවර්ධනයේ මූලික අරමුණ වන්නේ ව්‍යාපාරිකයන් අතර යහපත් හා සාධාරණ තරඟයක් ප්‍රවර්ධනය කිරීම සහ නිදහස් හා සාධාරණ වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම වේ. 2010 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද තරඟකාරීත්ව ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අංක 06 වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 06 - 2010 වසරේදී ක්‍රියාත්මක කරන ලද තරඟකාරීත්ව ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|
| (අ) මහජනතාවගේ යහපතට පටහැනිව සිදුකරන තරඟ විරෝධී චර්යාවලට මැදිහත් වීම, සිදුවියහැකි තරඟ විරෝධී චර්යා හඳුනාගැනීම සඳහා අධිකාරිය විසින් ආරම්භකරන ලද විමර්ශන | 01 |
| (ආ) ව්‍යාපාරික පැමිණිලි විමර්ශනය තරඟ විරෝධී චර්යා සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් පිළිබඳව අධිකාරියට ලැබෙන පැමිණිලි සඳහා මැදිහත් වීම | 09 |
| (ඇ) වෙළෙඳපොළ ව්‍යුහය සහ හැසිරීම හඳුනා ගැනීම වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම | භාණ්ඩ වර්ග 25ක් සඳහා |
| (ඈ) වෙළෙඳපොළ සමීක්ෂණ සිදුකිරීම හා පාරිභෝගික ආරක්ෂණය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | 02 |
| (ඉ) යහපත් තරඟකාරීත්වය සහ ව්‍යාපාරිකයින් සතු වගකීම් පිළිබඳ දැනුවත් කිරීම | 04 |
| (ඊ) තරඟකාරීත්ව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පසුබිම පවත්වා ගැනීම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගැසට් නිවේදන (2007/07/11 දින දරණ) අංක 1505/15 යටතේ භාණ්ඩ 5ක් දැනට හඳුනාගෙන ඇත. | 338 |

2010 වසර තුළ දී සිමෙන්ති කර්මාන්තය සඳහා වෙළෙඳ පොළ මිලක් නියම කිරීමටත් දත් බෙහෙත් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය නියම කිරීමටත් අධිකාරියට හැකි විය. එමෙන්ම ළදරු කිරිපිටි කර්මාන්තයෙහි පවතින දුර්වලතා පිළිබඳ අධ්‍යයනය කිරීමටත් හැකි විය.

(a). සිමෙන්ති පිළිබඳ කරන ලද අධ්‍යනය

වෙළෙඳපොල ව්‍යුහය සහ තරගකාරිත්වය පිළිබඳ සොයාබැලීම මෙහි අරමුණ වූ අතර 65% ක වෙළෙඳපොල කොටසක් සමාගම් 2 ක් මගින්ද 90% ක වෙළෙඳපොල කොටස සමාගම් 4 ක් මගින්ද පාලනය වන බව හඳුනාගන්නා ලදි.

(b). දත් බෙහෙත් පිළිබඳ කරන ලද අධ්‍යනය

2009 අගෝස්තු 15 වන දින සිට දේශීයව නිෂ්පාදනය කරනු ලබන දත් බෙහෙත් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය අනිවාර්යය කරන ලද අතර සියලුම නිෂ්පාදකයන් මීට අනුගත වන්නේදැයි සොයාබැලීම සඳහා අධ්‍යනයක් සිදුකරන ලදි.

(c). ළදරු කිරිපිටි පිළිබඳ කරන ලද අධ්‍යනය

මෙම අධ්‍යනය මගින් 2007,2008,2009 සහ 2010 වසර වල ළදරු කිරිපිටි මිල සංසන්දනය කරන ලද අතර අධික මිළකට විකුණන්නේද යන්න පිළිබඳව අධ්‍යනයක් සිදුකරන ලදි.

## 6.සාධාරණ මිල කිරීමක් සහතික කිරීම

### (අ)විශේෂිත භාණ්ඩවල මිල නියාමනය

පනතේ 14, 18, 19 සහ 20 යන වගන්තිවලින් ලබාදී ඇති බලතලවලට අනුකූලව හඳුනාගත් භාණ්ඩවල වෙළෙඳපොළ මිල ගණන් සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අධිකාරිය මැදිහත් වේ.
තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායීකරණය / මිල තීරණය කිරීම උදෙසා අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග වගු අංක 07න් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 07 - භාණ්ඩ මිල ස්ථායීකරණය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගන්නා ලද ක්‍රියාමාර්ගය |
|---|---|
| කුකුල් මස් | පවත්නා පිරිවැය සංරචක සැලකිල්ලට ගෙන පනතේ 20(5) යටතේ ශීතකළ හම සහිත බ්‍රොයිලර් කුකුළු මස් කිලෝග්‍රෑම් එකක උපරිම සිල්ලර මිල |

| | |
|---|---|
| | රු.350.00 ලෙස නියම කිරීම. |
| සිමෙන්ති | පිරිවැය විශ්ලේෂණයකින් අනතුරුව 2010 මාර්තු මාසයේ දී Ordinary Portland සිමෙන්ති, Portland Limestone සිමෙන්තිවල මිල රු.750/- ක් ලෙසද Masonry සිමෙන්තිවල උපරිම සිල්ලර මිල රු.700/- ක් ලෙසද නියම කිරීම |
| කිරිපිටි | පවත්නා පිරිවැය ව්‍යුහය පදනම් කරගෙන සම්පූර්ණ යොදය සහිත කිරිපිටිවල උපරිම සිල්ලර මිල නියම කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කටයුතු කරන ලදි. ඒ අනුව 2010 ජුනි මාසයේදී සම්පූර්ණ යොදය සහිත ග්‍රෑම් 400 කිරිපිටි පැකැට්ටුවක මිල රු.264/=ක උපරිම සිල්ලර මිලක් සහ කිලෝග්‍රෑම් එකක සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක මිල රු.598/- ක් ලෙසද නියම කරන ලදි. |
| සහල් | 2010 වර්ෂය තුළ දී සරුසාර වී අස්වැන්නක් ලැබීම නිසා ආහාර සුරක්ෂිතතා හා ජීවන වියදම් කැබිනට් අනු කමිටුවෙන් ලද උපදෙස් මත සහල් සඳහා පණවා තිබූ උපරිම සිල්ලර මිල සීමාව 2010 සැප්තැම්බර් මාසයේ දී ඉවත් කරන ලදි. සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල ඉවත් කිරීමෙන් පසුව වෙළෙඳපොළේ සහල් මිල ක්‍රමයෙන් වැඩි වූ බව නිරීක්ෂණය කරන ලදි. එම තත්ත්වය පාලනය කිරීම සඳහා 2010 දෙසැම්බර් මාසය තුළ දී නැවත සහල් සඳහා පහත සඳහන් ලෙස උපරිම සිල්ලර මිල නියම කරන ලදි.<br>සම්බා ගල්වැලි ඉවත්කර පිරිසිදු කරන ලද කිලෝග්‍රෑම් එකක් රු. 70/-<br>(කීරි සම්බා සහ සුදුරු සම්බා හැර)<br>නාඩු කිලෝග්‍රෑම් එකක් රු. 60/-<br>රතු හා සුදු කැකුළු කිලෝ ග්‍රෑම් 01 ක් රු.60.00 |

**ද්‍රවිකෘත පෙට්‍රෝලියම් ගෑස්**

ද්‍රවිකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල 2007 වර්ෂයේ මුල් භාගයේ හඳුන්වා දුන් මිල සූත්‍රයට අනුව ක්‍රියාත්මක වන අතර, වර්තමානයේ ප්‍රධාන සැපයුම්කරුවන් දෙදෙනෙකු මෙම වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වේ.

**වගු අංක 08 - පෙට්‍රෝලියම් ගෑස් කිලෝග්‍රෑම් 12.5 සිලින්ඩරයක මිල වෙනස් වීම 2010**

| මාසය | 2010 |
|---|---|

| | ෂෙල් ගෑස් (රු.) | ලාෆ් ගෑස් (රු.) |
|---|---|---|
| ජනවාරි | 1550 | 1421 |
| මාර්තු | 1550 | 1421 |
| මැයි | 1769 | 1744 |
| ජූලි | 1652 | 1659 |
| සැප්තැම්බර් | 1652 | 1593 |
| නොවැම්බර් | 1652 | 1520 |







## 7. ආයතනික හැකියාවන් පුළුල් කිරීම

(අ)සේවක මණ්ඩල සංවර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සේවක සංවර්ධන වැඩසටහන් හඳුන්වා දෙමින් අධිකාරිය මගින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදි. 2010 වසරේදී ක්‍රියාත්මක කරන ලද සේවක සංවර්ධන වැඩසටහන්වල තොරතුරු වගු අංක 09න් දැක්වේ.

**වගු අංක 09 - සේවක සංවර්ධන වැඩසටහන් - 2010**

| | පාඨමාලාවේ නම | සහභාගී වූ සංඛ්‍යාව | පාඨමාලා ගාස්තුව | මුළු වියදම (රු) |
|---|---|---|---|---|
| 1 | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා වන සම්මන්ත්‍රණය | 3 | 3,000.00 | 9,000.00 |
| 2 | Advance MS Office | 8 | 9,000.00 | 72,000.00 |
| 3 | ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 10 | 14,000.00 | 140,000.00 |
| 4 | ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 2 | 500 | 1,000.00 |
| 5 | දත්ත විශ්ලේෂණය සඳහා වන සංඛ්‍යාන පැකේජය පිළිබඳ පාඨමාලාව | 3 | 10,000.00 | 30,000.00 |
| 6 | විධායක ලේකම්වරුන් සහ පරිපාලන සහකාරවරුන් සඳහා වන ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 20,000.00 | 20,000.00 |
| 7 | වෘත්තිමය ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 15,000.00 | 15,000.00 |
| 8 | ලේඛනත්ව භාවිතය හා පරිපාලනත්ව අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 35,000.00 | 35,000.00 |
| 9 | දෙමළ භාෂාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 13 | 7,500.00 | 97,500.00 |
| 10 | ජාත්‍යන්තර සමුපකාර නීති සම්මන්ත්‍රණය | 1 | 11,950.00 | 11,950.00 |
| 11 | ජාත්‍යන්තර මානව සම්පත් සම්මන්ත්‍රණය 2010 | 2 | 13,843.00 | 27,686.00 |
| 12 | Sage ACCPAC Advance Financial Modules | 3 | 17,319.46 | 51,958.38 |
| 13 | ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 3,500.00 | 7,000.00 |
| 14 | ලිපිකරු සේවාව හා බැඳුණු වෘත්තීමය නිපුණතාවය | | | - |
| | පිළිබඳ වූ වැඩමුළුව | 2 | 3,000.00 | 6,000.00 |
| 15 | ලේඛනත්ව භාවිතය පිළිබඳ වැඩසටහන | 2 | 13,843.00 | 27,686.00 |
| 16 | ප්‍රවාහන කළමණාකරණය පිළිබඳ වැඩසටහන | 2 | 2,500.00 | 5,000.00 |
| 17 | AATSL වාර්ෂික සම්මන්ත්‍රණය- 2010 | 1 | 4,500.00 | 4,500.00 |
| 18 | රාජකාරී ජීවිතය හා සෞන්දර්යාත්මක රසවින්දනය පිළිබඳ වැඩසටහන | 6 | 3,450.00 | 20,700.00 |
| 19 | ඵලදායිතා නීති සම්මන්ත්‍රණය | 5 | 4,500.00 | 22,500.00 |
| 20 | මහජන සම්බන්ධතා පිළිබඳ වැඩමුළුව | 1 | 5,196.00 | 5,196.00 |
| 21 | ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ අය-වැය-2011 | 4 | 1,000.00 | 4,000.00 |
| 22 | විධායක ලේකම් සහ පුද්ගලික සහකාර උසස් පාඨමාලාව | 1 | 27,500.00 | 27,500.00 |
| | **මුළු වියදම** | | | **696,421.38** |

| | | | | |
|---|---|---|---|---|
| 23 | පරිගණක පද්ධති පාලන පුහුණු පාඨමාලාව | 1 | නොමිලේ පැවැත් වූ වැඩසටහනකි | |
| 24 | වෙබ් අඩවි නිර්මාණය - I C T A | 1 | නොමිලේ පැවැත් වූ වැඩසටහනකි | |

**(ආ) අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත් කිරීම**

**වගු අංක 10: - 31.12.2010 දිනට අධිකාරියේ සේවක මණ්ඩල සංයුතිය**

| තනතුර | අනුමත සේවක මණ්ඩලය 19.05.2011 දිනට | සේවක සංඛ්‍යාව 31.12.2010 දිනට |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ කළමණාකරණ** | | |
| අධ්‍යක්ෂ ජෙනරාල් | 1 | - |
| අධ්‍යක්ෂක | 6 | 5 |
| සභාවේ ලේකම් | 1 | 1 |
| **කළමණාකරණ** | | |
| සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂක | 16 | 6 |
| **කණිෂ්ඨ කළමණාකරණ** | | |
| විගණන නිලධාරි | 2 | - |
| පද්ධති පාලක | 1 | - |
| ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි | 02 | - |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි | 1 | - |
| ජ්‍යෙෂ්ඨ වෙළෙඳ පොළ පර්යේෂණ විශ්ලේෂක | 1 | 1 |
| ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි | 2 | 2 |
| රහස්‍ය ලේකම් ( අධ්‍යක්ෂ ජෙනරාල්) | 1 | 1 |
| රහස්‍ය ලේකම් ( සභාපති ) | 1 | 1 |
| ජ්‍යෙෂ්ඨ පරිපාලන/මානව සම්පත් නිලධාරී | 1 | - |
| ජ්‍යෙෂ්ඨ නීති හා බල ගැන්වීම් නිලධාරී | 2 | 2 |
| ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරි | 1 | 1 |
| ජ්‍යෙෂ්ඨ පාරිභෝගික බලගැන්වීම් නිලධාරී | 2 | - |
| ජ්‍යෙෂ්ඨ මාධ්‍ය නිලධාරි | | 1 |
| **බලගැන්වීම්/මෙහෙයුම්/ව්‍යාපෘති** | | |
| දත්ත සම්බන්ධීකාරක | 1 | - |
| සංඛ්‍යාන නිලධාරී | 1 | - |
| වෙළෙඳපොල පර්යේෂණ විශ්ලේෂක | 1 | - |
| ප්‍රලේඛන නිලධාරි | 6 | 1 |
| පුස්තකාලාධිපති | 1 | - |
| පිරිවැය නිලධාරි } | 15 | 1 |
| ගණකාධිකාරි | | 4 |
| පරිපාලන නිලධාරි | 5 | 1 |
| අනුකූලවීම් සහ බලගැන්වීම් නිලධාරී | 3 | 2 |
| විමර්ශන නිලධාරී | 200 | 161 |
| **කළමණාකරණ සහකාර-තාක්ෂණික** | | |
| පොත් තබන්නා | 1 | - |

| | | |
|---|---|---|
| **කළමණාකරණ සහකාර-තාක්ෂණික නොවන** | 31 | 36 |
| **ප්‍රාථමික මට්ටමේ කුසලතා සහිත** | | |
| රියදුරු | 12 | 13 |
| කාර්යාල කාර්යය සහයක | 14 | 16 |
| **Total** | **332** | **256** |

**(ඇ)සේවක සුභ සාධනය**

2010 වසරේදී සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් සහ සේවක වන්දි රක්ෂණ ක්‍රමයක් ඇරඹීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරන ලදි.

එසේම සේවක ඵලදායිතාව නංවීම උදෙසා ඉවහල්වන ප්‍රසන්න කාර්යාල පරිසරයක් ඇතිකිරීම උදෙසා පියවරයන් කිහිපයක්ම ගන්නා ලදි. සියලුම මට්ටම්වල සේවකයන්ගේ සමගිය, අධ්‍යාත්මික සංවර්ධනය නැංවීම සඳහා ද පියවර ගන්නා ලදි.

**(ඈ ) පාරිභෝගික අධිකාරිය පනත සඳහා සංශෝධන**

2009 දෙවන කාර්තුවේ දී කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කරන ලදි. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ උපදෙස් අනුව සිදු කළ වෙනස් කිරීම්වලට පසුව අවසන් කෙටුම්පත අමාත්‍යාංශයට යවා ඇත. යෝජිත සංශෝධනයන් පිළිබඳව නීති කෙටුම්පත් කාර්යාලය හා නීතිපති දෙපාර්තමේන්තුව සමග පාරිභෝගික අධිකාරිය සම්බන්ධීකරණය කරනු ලබයි.

## <u>පාරිභෝගික සභාවේ ක්‍රියාකාරිත්වය</u>

පාරිභෝගික කටයුතු  සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමග ක්‍රියාත්මක වන අතර අධිකාරිය විසින් සභාව වෙත එවනු ලබන යොමු කිරීම් සහ ප්‍රධාන වශයෙන්ම තරග විරෝධී චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මගින් බලය පවරා ඇත. පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිල ගණන් , වෙළෙඳපොළ අඩුලුහුඩුකම් සහ වෙළෙඳපොළ හැසිරවීම් සම්බන්ධයෙන් ද විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හි දී භාණ්ඩ හා සේවා සැපයිය යුතු උපරිම මිල ගණන් නිර්දේශ කිරීමට සභාවට බලය දී ඇත.

2010 දී කුකුල් මස්, සිමෙන්ති, සහල් සහ කිරිපිටි සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල නියම කරන ලද අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(4) වගන්තියෙහි ප්‍රතිපූරණ අනුව උපරිම මිල නියම කරන ලදි.

2010 දී පැමිණිලි 4 ක් සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග සම්පූර්ණ කරන ලදි. වසර තුළදී අසාධාරණ වෙළෙඳ පිලිවෙත් සම්බන්ධව පැමිණිලි 2 ක් විමර්ශනය කරන ලදි. එසේම අධිකාරිය පනතේ 19 වන වගන්තිය යටතේ වන පැමිණිලි 4 ක් සභාව මගින් මෙහෙයවන ලදි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | 2010<br>රු.000 | 2010<br>රු.000 | 2009<br>රු.000 | 2009<br>රු.000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 29,713 | | 21,165 | |
| ආයෝජන ( LT ) | 52,992 | | 45,887 | |
| සේවක මණ්ඩල ණය(LT) | 10,277 | | 8,164 | |
| | | 92,982 | | 75,216 |
| **ජංගම වත්කම්** | | | | |
| භාණ්ඩ ලේඛන /තොග | 446 | | 500 | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 13,725 | - | 11,199 | |
| රජයේ ණයගැතියෝ | 21,838 | | 21,838 | |
| පූර්ව ගෙවීම් | - | | 3 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 39,448 | | 19,682 | |
| | | 75,457 | - | 53,222 |
| **මුළු වත්කම්** | | **168,439** | | **128,438** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු මුදල් | 1,893 | | 668 | |
| උපචිත වියදම් | 18,692 | | 14,502 | |
| | | 20,585 | | 15,170 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ප්‍රදාන අරමුදල | - | | 9 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 11,565 | | 9,526 | |
| | | 11,565 | | 9,535 |
| **මුළු වගකීම්** | | **32,150** | | **24,705** |
| **මුළු ශුද්ධ වත්කම්** | | 136,289 | | 103,733 |
| **ශුද්ධ වත්කම්/ හිමිකම** | | | | |
| සමුච්චිත අරමුදල | 72,992 | | 63,191 | |
| විලම්බිත ආදායම | 37,520 | | 26,727 | |
| සංචිත | 25,777 | | 13,815 | |
| මුළු ශුද්ධ වත්කම්/ හිමිකම | | 136,289 | | 103,733 |
| | | 136,289 | | 103,733 |

.............................
අධ්‍යක්ෂ මුදල
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

C. N. [illegible]
.............................
අධ්‍යක්ෂ ජෙනරාල් (වැඩබලන)
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

.............................
[illegible]
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2010/12/31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | 2010<br>රු.000 | 2009<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 143,029 | 115,919 |
| අනෙකුත් ආදායම් | 9,854 | 16,570 |
| | **152,883** | **132,488** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක පඩිනඩි | 85,944 | 75,978 |
| ගමන් වියදම් | 2,998 | 1,970 |
| සැපයුම් සහ පරිභෝජන භාවිත | 5,638 | 6,822 |
| නඩත්තු | 5,774 | 3,297 |
| කොන්ත්‍රාත්ගත සේවා | 18,831 | 19,392 |
| ක්ෂය වීම | 6,306 | 9,807 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 15,411 | 9,157 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **140,904** | **126,422** |
| **මෙහෙයුම් කාර්යන් තුළින් ජනිතවූ අතිරික්තය/(හිඟය)** | **11,979** | **6,066** |
| මූල්‍ය පිරිවැය | 57 | 51 |
| මුළු මෙහෙයුම් නොවන වියදම් | 57 | 51 |
| අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(හිඟය) | 11,922 | 6,014 |
| වත්කම් අපහරණයෙන් ලද ලාභය | 40 | - |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය) | **11,962** | **6,014** |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2010/12/31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2010<br>රු.000 | 2009<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් කර්යන් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ අතිරික්තය/ (හිඟය) | 11,922 | 6,014 |
| ගැලපුම් | | 9,807 |
| **ක්ෂය** | 6,036 | |
| පාරිතෝෂික ප්‍රතිපාදන ඉහලයාම | 2,038 | 2,030 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **20,266** | **17,851** |
| ගෙවිය යුතු වියදම් ඉහළයාම - සටහන I | 5,406 | 5,046 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම- සටහන II | (2,471 | 9,346 |
| මෙහෙයුම් කාර්ය තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | 23,201 | 32,243 |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (4,627) | (12,403) |
| පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභ | 435 | |
| අයෝජන ඉහලයාම | (7,105) | (14,298) |
| දිගුකාලීන ණය ඉහලයාම | (2,113) | (8,164) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **(13,410)** | **(34,865)** |
| **මූල්‍ය කටයුතු තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| විලම්බිත ආදායම | 10,794 | 2,597 |
| පාරිභෝගික ආරක්ෂණ අරමුදල | 9,803 | 8,595 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | (10,622) | |
| **මූල්‍ය කටයුතු තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **9,975** | **11,192** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ඉහලයාම/(අඩුවීම)** | **19,766** | **8,570** |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 19,682 | 11,112 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ | 39,448 | 19,682 |

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### 2010/12/31 දිනට අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2010<br>රු.000 | 2009<br>රු.000 |
|---|---|---|
| <u>සටහන 1</u> | | |
| **<u>ගෙවිය යුතු වියදම්</u>** | | |
| උපචිත වියදම් | 4,190 | 4535 |
| ගෙවිය යුතු වියදම් | 1,225 | 511 |
| සුභ සාධක අරමුදල | (9) | |
| **ගෙවිය යුතු වියදම් ඉහළ යාම** | <u>5,406</u> | <u>5,046</u> |

| | 2010<br>රු.000 | 2009<br>රු.000 |
|---|---|---|
| සටහන II | | |
| **<u>අනෙකුත් ජංගම වත්කම්</u>** | | |
| භාණ්ඩ ලේඛන / තොග | 54 | 13 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | (1,659) | 11960 |
| සේවා සඳහා අත්තිකාරම් | (832) | 449 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | (1,443) | (844) |
| පූර්ව ගෙවීම් | 3 | (3) |
| ලැබිය යුතු දඩමුදල් | (869) | 46 |
| ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන | (2,275) | **(2,275)** |
| **අනෙකුත් ජංගම වත්කම් ඉහළයාම** | <u>(2,471)</u> | <u>(9,346)</u> |

# ගිණුම් සඳහා සටහන්

## 1. සංස්ථාමය තොරතුරු

1.1 2003 අංක 09 දරන පාර්භෝගික කටයුතු අධිකාරී පනත යටතේ පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්ථාපිත කරන ලදී. සාධාරණ වෙළඳ කොමිසමේ හා අභ්‍යන්තර වෙළඳ කටයුතු දෙපාර්තමේන්තුවේ සියලුම වත්කම් හා වගකීම් පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවරා ගන්නා ලදී. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව රජයේ දෙපාර්තමේන්තුවක් වූ හෙයින් එහි වත්කම්වල පිරිවැය ලබාගත නොහැකි විය. එබැවින් එම වත්කම් ගිණුම් පොත්වල ඇතුලත් කරන ලද්දේ විශේෂ කමිටුවක තක්සේරුවක් අනුවය.

1.2 <u>මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය</u>

අධිකාරියේ මූලික කාර්ය වනුයේ පාර්භෝගිකයා ආරක්ෂා කිරීමත් වෙළඳාම නියාමනය කිරීමත් ය.

1.3 වර්ෂය අවසානය වන විට අධිකාරියේ සේවා නියුක්තිකයින් ගණන 249 කි.

1.4 කොටස් හිමිකාරිත්වය/ හිමිකම

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සඳහා පූර්ණ වශයෙන්ම මහා භාණ්ඩාගාරය ප්‍රදානයන් සපයයි. කෙසේ වුවත්, ස්කන්ධ ප්‍රාග්ධනය තුළ අධිකාරියෙහි සෘජු ආදායමක් ලෙස ගැනෙන දඩ මුදල් ආදායමෙන් 1/3 ක ප්‍රමාණයද අන්තර්ගත වේ.

1.5 අංක ටීඑ/අයිඑස්ඩී/3/සීඑ/2005 හා 2005.06.24 දින දරණ භාණ්ඩාගාර ලිපිය අනුව 2005 වර්ෂය සඳහා වූ ගිණුම් වල රජයේ ණයගැතියන් යටතේ භාණ්ඩාගාරයේ තිබෙන රු.21,837,974.52 ක මුදල දක්වා ඇත. එම මුදල පාර්භෝගික කටයුතු අධිකාරියේ ආරක්ෂණ අරමුදල වෙත මුදාහරින මෙන් පාර්භෝගික කටයුතු අධිකාරිය වෙනුවෙන් රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් සිහි කැඳවීම් ගණනාවක් යවා ඇත.

1.6 වත්කම්වලට සම්බන්ධ රජයේ ප්‍රදාන හා මූල්‍ය නොවන විලම්භිත අදායම් වශයෙන් සාධාරණ අගයෙන් යුතුව ශේෂ පත්‍රයෙහි පෙන්නුම් කර ඇත. සාධාරණ වෙළඳ කොමිසම සහ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුවෙන් පවරන ලද වත්කම් විලම්භිත ආදායම් වශයෙන් සලකා ඇත.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 <u>අනුකූලතා ප්‍රකාශනය</u>

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ශේෂ පත්‍රය සහ අදාල ආදායම් ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

2.2 <u>පිළියෙල කිරීමේ පදනම</u>

ශ්‍රී ලංකා රුපියල් අගයෙන් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශනයන් අතීත පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.3 <u>සංසන්දනාත්මක තොරතුරු</u>

අධිකාරිය විසින් නොවෙනස්ව අඛණ්ඩව භාවිතා කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය සමග සංගතව දක්වා ඇත.

<u>දඩ මුදල් ආදායම</u>

දඩ මුදල් මගින් ලැබෙන ආදායම අධිකාරියෙහි සාමාන්‍යය පරිපාලන කටයුතු සඳහා ප්‍රයෝජනයට නොගන්නා බැවින්, එම ආදායම්, ආදායම් ප්‍රකාශයෙන් වෙනම ගිණුමක ඇතුලත් කෙරේ. එබැවින් දඩ මුදල් උත්පාදනය වන්නා වූ ආදායමෙන් අදාල කොටස (පනවන ලද දඩ මුදලින් 1/3) තොළිදරව් කිරීමේ අරමුණ සඳහා ආරක්ෂණ අරමුදල් ගිණුමේ ගිණුම්ගත කෙරේ.

2.4 <u>මූල්‍ය වර්ෂය</u>

අධිකාරියේ මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය වේ.

## 3. <u>වත්කම් මූලයන් සහ ඒවායේ ඇගයීම</u>

### 3.1 දේපල යන්ත්‍ර සහ උපකරණ

3.1.1 දේපල යන්ත්‍ර සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකිරීමෙන් පසුව සටහන් කෙරේ.

3.1.2 දේපල යන්ත්‍ර සහ උපකරණ පිරිවැය යනු එම වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දැරීමට සිදුවන ඕනෑම වියදමක්ද ඇතුලත්ව ඒවා මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට දැරිය යුතු පිරිවැයයි.

3.1.3 ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා හෝ වත්කමෙහි ආයුකාලය වැඩි කිරීම සඳහා වූ අර්ථයෙන් ස්ථිර ස්වභාවයක වත්කමක් අත්කර කරගැනීමේදී, ව්‍යාප්ත කිරීමේදී හෝ වැඩිදියුණු කිරීමේදී දැරීමට සිදුවන වියදම ප්‍රාග්ධන වියදම ලෙස සලකනු ලැබේ.

3.2. <u>ක්ෂය කිරීම</u>

ගිණුම් ප්‍රමිති අංක 18ට අනුව වත්කමක් පාවිච්චියට ගන්නා අවස්ථාවේ පටන් කරණ ක්ෂයවීම් හැර අවම වශයෙන් වත්කමක ආයු කාලය හා ලියාපදිංචිය පසු අගය වාර්ෂිකව ප්‍රත්‍යාගනනය කළයුතුය. ඒ අනුව 2010 ජනවාරි 1 වන දින සිට අධිකාරියට අත්පත් කර ගන්නා ලද සියළුම වත්කම් පාවිච්චියට ගන්නා මාසයේ පටන් ක්ෂය කිරීම කරණ ලදී.

3.2.1 දේපල, යන්ත්‍ර සහ උපකරණ පිරිවැය, ඒවායෙහි ඇස්තමේන්තුගත ජීවිත කාලයට අනුව කපාහැරීම සඳහා පහත පරිදි සංගත පදනම මත ක්ෂයවීම් සපයා ඇත.

| | |
|---|---|
| කාර්යාලයීය ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| කාර්යාලයීය උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| මෝටර් රථ | 20% |
| කාර්යාලයීය කොටස් කිරීම | 20% |
| පාරිභෝජන නොවන භාණ්ඩ | 10% |

3.2.2 ක්ෂයවීම් ආගණනයේදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සරල මාර්ග ක්ෂය ක්‍රමය භාවිතා කරයි.

3.2.3 අදාල වත්කම් මිලදීගත් වර්ෂය තුලදී භාවිතයට ගෙන ඇති විට එම මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර අදාල වත්කම් ඉවත්කරනු ලබන වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු නොලැබේ. පුස්තකාල පොත් සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු නොලැබේ.

3.3 <u>ණයගැතියන් සහ ලැබිය යුතු දෑ</u>

ණයගැතියන් සහ ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වීම සඳහා ඇස්තමේන්තු කොට ඇති වටිනාකමට අනුව සඳහන් කොට තිබේ.

3.5 <u>බඩු තොග</u>

බඩු තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන්නෙන් අඩු අගය යටතේ තක්සේරු කරනු ලැබේ.

3.6 <u>මුදල් සහ ඒ හා සමාන වත්කම්</u>

මුදල් සහ ඒ හා සමාන වත්කම්, අතැති මුදල්, බැංකුවෙහි තැන්පත් මුදල් සහ කෙටිකාලීන ආයෝජන ලෙස අර්ථ නිරූපනය කෙරේ.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හා ඒ හා සමාන අයිතමයන් වශයෙන් අතැති මුදල් සහ බැංකු තැන්පත්වල එකතුවෙන් නොගෙවූ බැංකු ණය අඩු කොට දක්වා ඇත.

## 4 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>

4.1 <u>ගෙවිය යුතු දෑ</u>

ගෙවිය යුතු දෑ පිරිවැය මත සඳහන් කොට ඇත.

### 4.2 <u>විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම</u>

#### 4.2.1 නිර්දේශිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂික

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි. අදාළ ව්‍යවස්ථාව ප්‍රකාර අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී. මෙම වගකීම සපුරාලීම පිණිස, සියලුම සේවා නියුක්තිකයන් සඳහා තම සේවයෙහි පළමු වර්ෂයෙන් ආරම්භව සේවා කාලයෙහි ඔහු සම්පූර්ණ කරනු ලබන සෑම වර්ෂයක් සඳහාම, මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුප මත පදනම්ව ගණනය කරන ලද මුදලට සමාන වටිනාකමක් සහිත වෙන් කිරීමක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන ගොස් ඇත. වර්ෂය අවසානයේ ආදායම් ප්‍රකාශය තුළ පසුගිය වසරේ ඉදිරියට ගෙන එනු ලැබූ ශේෂයත් මෙම වසරේ වෙන්කිරීමත් අතර වෙනස දක්වා ඇත.

SLAS 16 ප්‍රකාරව තම සේවයෙහි වර්ෂයක අවම කාලයක් සම්පූර්ණ කරන ලද සේවා නියුක්තිකයන් සඳහා පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගණනය කොට ඇත. භාණ්ඩාගාරය විසින් අත්තිකාරම් වශයෙන් අරමුදල් නිදහස් නොකරන බැවින් පාරිතෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, පාරිතෝෂික සැලසුම් සඳහා උපකාරී වන කිසිදු අරමුදලක් ආයෝජනය කොට නැත.

#### 4.2.2 නියමිත දායකත්ව සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථාවන් හා කොන්දේසි අනුව යමින් සියළුම සේවා නියුක්තිකයින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබති. සේවා නියුක්තිකයින් ආවරණය වන්නාවූ, අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සිදුකරනු ලබන සේවා යෝජක දායකත්වය ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

අධිකාරිය විසින් සේවා නියුක්තිකයන්ගේ දළ පරිශ්‍රමිකයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් 15%ක් සහ 3%ක් දායක කරනු ලැබේ.

### 4.3 <u>අවිනිශ්චිත වගකීම</u>

බේරුම් කිරීම - සීමාසහිත ෂෙල් ගෑස් සමාගම

සීමාසහිත ෂෙල් ගෑස් සමාගම රජයට පවරාගෙන එහි නම ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම (Litro Gas Lanka Limited) වශයෙන් වෙනස් කොට ඇත. එම නිසා සමාගමේ තත්ත්වය රාජ්‍ය ආයතනයක මට්ටමට පත් ව ඇත. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම 2011 ජනවාරි 31 දින ලිපියක් මගින් දන්වා ඇත්තේ බේරුම්කිරීම සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීමට ඔවුන්ගේ නීතිඥයන්ගේ අදහසක් නැති බවයි.

## 5. <u>ආදායම</u>

දඩ මුදල් මගින් ලැබෙන ආදායම උපචිත පදනම මත සළකා බැලේ.

6. පුද්ගලික ප්‍රස්තුතයන් හැරුණු විට, ප්‍රතිපත්තියක් ලෙස ශ්‍රී ලංකා මුදලින් රු.1,000/-ට වැඩි වටිනාකමක් සහිත අයිතමයන් හෝ වසරකට වැඩි කාලයක් භාවිතා කළහැකි අයිතමයන් ප්‍රාග්ධනිත කර ඇත. අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් පවරාගත් අයිතමයන් හැර ආනයන බදු සහ අනෙකුත් සෘජු පිරිවැය ඇතුළත්ව ස්ථාවර වත්කම් ඒවායේ මිලදීගත් වටිනාකම මත අගය කොට ඇත.

7. වර්ෂය සඳහා භාණ්ඩාගාරය මඟින් පූර්ණ වශයෙන් මුදාහරින ලද ප්‍රාග්ධන අරමුදල්වල මූල්‍යමය වටිනාකම වර්ෂය අවසාන වනවිට පූර්ණ වශයෙන් උපයෝගී කරගෙන ඇති අතර, එය සමුච්චිත අරමුදල යටතේ ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස දක්වා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No: එස්සී/එෆ්/සීඑච්/එෆ්ඒ/2010
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2011 ඔක්තෝබර් 31 දින


සභාපති,
පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

**පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2003 අංක 09 දරන පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 ඔක්තෝබර් 28 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල්


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone: 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail: oaggov@sltnet.lk

විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

--------------------------------------------------

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්ය විසින් 2011 පෙබරවාරි 28 දින කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර, රු.1,618,144 ක ගිණුම්කරණ අඩුපාඩු ගැලපීම් කිරීමෙන් පසුව නැවත 2011 අගෝස්තු 02 දින අධිකාර්ය විසින් අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.

### 2.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්ය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2:3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්යේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රු.6,306,189 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය, ක්ෂය වෙන් කිරීමේ ගිණුමට බැර කිරීමට අමතරව ඊට සමාන වටිනාකමක් විලම්භිත ආදායම් ගිණුම් හර කර විවිධ ආදායම් ගිණුම බැර කර තිබුණි. ක්ෂය වෙන් කිරීම් සඳහා වූ ගිණුම්කරණ සටහන මගින් මේ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ උපචිත වියදම් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතු කොටගෙන ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර රු.2,901,401 ක වෙනසක් නිරූපණය විය. එම වෙනස ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ගිණුම්වලට ගැලපීම නිසා වියදම් ගිණුම් 22 ක එකතුව රු.2,901,401 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් මස දඩ මුදල් ආදායම ලෙස අධිකාරිය වෙත ලැබී තිබුණු එකතුව රු.1,246,064 ක් ගෙවිය යුතු ශේෂ යටතේ වූ පාර්භෝගික ආරක්ෂණ අරමුදල සඳහා වෙන් කිරීමේ ගිණුමෙහි ඇතුළත් කර තිබුණි.

### 2.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල විකුණන ලද ස්ටාවර වත්කම්වල පිරිවැය රු.2,454,630 ක් ලෙස දක්වා තිබුණද සත්‍ය විකුණුම් වත්කම්වල පිරිවැය රු.2,442,859 ක් වීම නිසා රු.11,771 ක වෙනසක්ද, මූල්‍ය ප්‍රකාශනවල දඩ මුදල් ආදායම රු.11,823,067 ක් ලෙස දක්වා තිබුණද ප්‍රගති වාර්තා අනුව එය රු.11,416,900 ක් ලෙස දක්වා තිබීම නිසා රු.406,167 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

### 2.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ඒකකයක් පිහිටුවා තිබුණු අතර, ඒ සඳහා වැය කර තිබුණු මුදල රු.400,000 ක් විය. පර්යේෂණ ඒකකය පිහිටුවීම සඳහා වූ අනුමැතිය, ඉදිරි සැලසුම් හා කාර්යසාධන සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

2.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(1) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

(i) පනතේ 27 වන වගන්තිය අනුව සෑම වෙළෙන්දෙකුම මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන රු.100,000 ක් නොඉක්මවූ වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත අධිකාරියේ ලියාපදිංචි විය යුතු වුවත් මේ දක්වා කිසිදු වෙළෙන්දෙකු ලියාපදිංචි කිරීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි. මෙය ප්‍රායෝගිකව සිදු කිරීම අපහසු බව අධිකාරිය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකයන් අදාල ක්ෂේත්‍රයන්හි පිළිගත් සුදුසුකම්, පළපුරුද්ද හා විශිෂ්ඨත්වයක් ලබා ගත්තවුන් විය යුතු වුවත් සාමාජිකයින් 08 දෙනෙකු ඒ ඒ විෂය ක්ෂේත්‍ර වල පිළිගත් සුදුසුකම් සපුරා නොතිබුණි.

(2) 1971 අංක 38 දරන මුදල් පනත 5 (සී) වගන්තිය අනුව අධිකාරිය සම්බන්ධයෙන් අවම අභ්‍යන්තර විගණන වැඩසටහනක් විගණකාධිපති සමඟ එකඟ වී සකස් කර ගත යුතු වුවත්, 2010 වර්ෂය තුළදී අධිකාරියේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක නොවිය.

(3) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 5.1.3 ඡේදය හා 5.2.1 ඡේදය අනුව අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මට අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශය, ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූලධන වියදම් අන්තර්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් සංයුක්ත සැලැස්ම සමඟ අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 9.2 ඡේදය අනුව අධිකාරියේ එක් එක් අංශ සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව ඇතුළත් ඒකාබද්ධ මානව සම්පත් අයවැයක් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතු වුවත් අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මට මානව සම්පත් අයවැයක් ඇතුළත් කර නොතිබුණි.

(iii) 9.10 ඡේදය අනුව කොන්ත්‍රාත් අනියම් හෝ වෙනත් ආකාරයක පත්වීමක් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත සිදු කළ යුතු වුවත්,විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2009 වර්ෂය තුළ කොන්ත්‍රාත්, අනියම් හා දෛනික සේවකයින් 05 දෙනෙකු හා 2010 වර්ෂය තුළ කොන්ත්‍රාත් සේවකයින් 13 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(v) 9.14.2 ඡේදය අනුව පර්පාලන ක්‍රියා පටිපාටි අත්පොත සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අධිකාර්ය විසින් පිළියෙල කර තිබූ පර්පාලන ක්‍රියාපටිපාටි අත්පොත අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(4) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 වගන්තිය අනුව අත්තිකාරම් මුදල අදාල කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත් 2006 සිට 2010 නොවැම්බර් දක්වා විටින් විට ගෙවා තිබුණු අත්තිකාරම් මුදල්වලින් රු.125,061 ක් 2010 දෙසැම්බර් 31 වනවිටත් පියවා නොතිබුණි.

(5) 2010 පෙබරවාර් 08 දිනැති හා අංක ඩීඑම්එස්/ඊ4/41/5/255/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 03 ඡේදය අනුව අධිකාර්යේ සේවක ප්‍රතිව්‍යුහගතකරණය සඳහා තනතුරුවලට නියමිත බඳවා ගැනීමේ හා උසස් කිර්මේ පර්පාටි සංශෝධනය කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතු වුවත් එසේ අනුමැතිය ලැබී නොතිබුණු සේවකයින් 79 දෙනෙකු 2010 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාල පර්ච්ඡේදය තුල අළුතින් බඳවා ගෙන තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිර්පත් කරන ලද අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාර්යේ වැඩ කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.11,962,185 ක අතිර්ක්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.6,014,435 ක අතිර්ක්තයක් වීමෙන් අතිර්ක්තයේ වැඩිවීම රු.5,947,750 ක් විය. අතිර්ක්තයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ මුදල් දායකත්වය වැඩි වීම හා ක්ෂය වියදම අඩුවීමයි.

## 3.2 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) (i) 2010 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 168 ක් වූ අතර, අතිරික්ත සේවකයින් සංඛ්‍යාව 107 ක් විය.

(ii) කොන්ත්‍රාත් පදනම මත පත්කළ එක් සේවකයෙකුද ඇතුළුව රියදුරන් 13 දෙනෙකු පත් කර තිබුණද, අධිකාරිය සතුව පැවති වාහන ගණන 08 ක් පමණක් විය.

(iii) රු.283,815 ක් වටිනා පුස්තකාල පොත් සහිත පුස්තකාලයක් අධිකාරිය සතුව පැවතුණද, පුස්තකාලාධිපති හා සහකාර පුස්තකාලයාධිපති තනතුරු පුරප්පාඩු වී තිබුණි.

(iv) අධිකාරිය සඳහා සරප් කෙනෙකු බඳවාගෙන නොතිබුණි.

(v) පරිවර්තන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලයේ වුවද, ඒ සඳහා නිසි බඳවා ගැනීමක් නොකොට, රු.160,382 ක මුදලක් පරිවර්තන ගාස්තු ලෙස වෙනත් පුද්ගලයන් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපතිවරයා විගණනය වෙත දන්වා තිබුණේ පවතින වැටුප් ව්‍යුහයන් තුළ නිලධාරියකු බඳවා ගැනීම ප්‍රායෝගික නොවන බවයි.

(vi) නාට්‍ය කාර්ය මණ්ඩලය තුළ ලඝු ලේඛක නිලධාරීන් 04 දෙනෙකු වුවද, වෘත්තීය ගාස්තු ලෙස රු.263,900 ක මුදලක් ගෙවා ලඝු ලේඛන සේවාවක් ලබාගෙන තිබුණු අතර, එම සේවාවේ අවශ්‍යතාවය හා අනුමැතිය සම්බන්ධව සභාපතිවරයා විගණනයට ඉදිරිපත් කර තිබුණේ වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම් විසින් 2009 සැප්තැම්බර් 29 දින සිට වසරක කාලයක් සඳහා ලබා දුන් අනුමැතියක් පමණි.

(ආ) විගණනයේදී අනාවරණය වූ පරිදි කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 06 දෙනෙකු නිකවැරටිය ප්‍රදේශයේ සේවයේ යොදවා තිබුණද, එම ප්‍රදේශයේ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවා නොතිබුණි. ඒ පිළිබඳ විස්තර විගණනය වෙත ඉල්ලා සිටියද, අධිකාරිය අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 අවිනිශ්චිත ස්වභාවයේ ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

#### (අ) කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල

කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වර්තමානයේ පවත්වාගෙන යනු ලබන්නේ කඩා ඉවත් කිරීමට යෝජිත කිසිදු සනීපාරක්ෂක හෝ ජල පහසුකමක් නොමැති පැරණි ගොඩනැගිල්ලක බැවින්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදි කරනු ලබන නව ගොඩනැගිල්ලක කාර්යාලය සඳහා කොටසක් වෙන් කර ගැනීමට 2009 හා 2010 වර්ෂවල එකතුව රු.මි. 1 ක මුදලක් ගෙවා තිබුණි. එසේම 2010 වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා ඇති පරිදි, වර්ෂය අවසාන වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇතත්, 2011 සැප්තැම්බර් 30 දින දක්වා ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

#### (ආ) මාධ්‍ය ඒකකයක් පිහිටුවීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 වර්ෂය තුළ අවිධිමත්/අධිකාර්ය මාධ්‍ය ඒකකයක් පිහිටුවා අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ මාධ්‍ය නිලධාරියෙක් රු.20,525 ක මාසික වැටුපකට 2010 ජුනි 01 දින සිට කොන්ත්‍රාත් පදනමින් පත් කර තිබුණි.

(ii) මෙම නිලධාරියා වෙත අනුයුක්ත කර තිබූ වාහනය සඳහා මාසිකව රු.50,000 ක කුලියක් හා මාසිකව ඉන්ධන ලීටර් 120 ක් ලබා දී තිබියදීත් අංක CAA/AHR/47/2010 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව, සංචිත වාහනයක් ලෙස සලකා සීමාරහිතව ඉන්ධන ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි.

(iii) මෙම නිලධාරියාට ගෙවා තිබූ අතිකාල සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, මාධ්‍ය කටයුතුවලට සම්බන්ධ රියදුරන් දෙදෙනෙකු හට මාසික වැටුප ඉක්මවා රු.49,643 ක අතිකාල දීමනාද, ඉන් එක් රියදුරෙකුට අමාත්‍යාංශයේ මාධ්‍ය රාජකාරී වෙනුවෙන් අතිකාල දීමනාද ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) වැටුප ඉක්මවා අතිකාල දීමනා ගෙවීම

අධිකාරියේ සේවකයන් 11 දෙනෙකුට 2010 වර්ෂයේ සමහර මාසවල මාසික වැටුප ඉක්මවා එකතුව රු.749,465 ක අතිකාල දීමනාද සමහර අවස්ථාවලදී වැටුපෙන් 75% ඉක්මවා එකතුව රු.266,244 ක අතිකාල දීමනාද ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා ආපදා ණය ගෙවීම

අධිකාරිය විසින් පිළියෙල කර තිබූ පරිපාලන ක්‍රියාපටිපාටි මඟපෙන්වීම්වලට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් තිදෙනෙකුට ආපදා ණය ලබා දී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපති විගණනයට දන්වා ඇත්තේ ණය ලබා දී ඇත්තේ එම සේවකයින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව බවයි. කෙසේ වුවද, සේවකයින් ස්ථිර කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඉ) අංක සීඑච්/එච්ආර්එ/97/2010/එම්බී - 09 - 04 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මත අමාත්‍යාංශය සතු වාහනයක් අධිකාරියට පවරා ගැනීමට තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු නොකර එම වාහනයේ අළුත්වැඩියා වෙනුවෙන් වෙන් කර තිබුණු රු.3,147,903 ක් උපචිත වියදම්වල ඇතුළත් කර තිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) වාහන පාලනය
(ආ) අත්තිකාරම් ලබාදීම
(ඇ) වාහන කුලියට ලබා ගැනීම
(ඈ) සේවක කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා සභාපතිවරයාගේ අදහස් දැක්වීම

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ආරම්භ කළ වර්ෂයේ සිටම අනුගමනය කරනු ලැබූ මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය ගිණුම්කරන සටහන් අංක 1.6 යටතේ දක්වා තිබුණි. ඉදිරි වර්ෂවලදී ක්ෂය වෙන් කිරීම සඳහා වූ ගිණුම්කරණ සටහන් යටතේද මේ පිළිබඳව සටහනක් යොදනු ඇත.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පාරිභෝගික අධිකාරියේ පවතින ක්‍රියාකාරී ස්වභාවය අනුව උපචිත වියදම් සත්‍ය උපචිත අගය මත ප්‍රතිපාදන සැලසීම ප්‍රායෝගිකව අපහසු කාර්යයකි. විශේෂයෙන් වෙළඳපළ වැටලීම් හා සම්බන්ධ ආශ්‍රිතවියදම් සත්‍ය අගය මත උපචිත කිරීම අපහසු වේ. එසේම දිස්ත්‍රික් කාර්යාලවල පරිපාලනය අදාල දිස්ත්‍රික් ලේකම්වරයා කරන බැවින් සේවක ප්‍රතිලාභ හා අනෙකුත් වියදම් පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට ලැබීම ප්‍රමාද වේ. කෙසේ නමුත් මේ සම්බන්ධව උපරිම අවධානය යොමු කරන අතර ඉදිරියේදී සත්‍ය අගය මත උපචිත වියදම සඳහා වෙන්කිරීම කිරීමට අවධානය යොමු කරමි.

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 58වන වගන්තිය අනුව රාජසන්තක කරනු ලබන භාණ්ඩවලින් ලැබෙන මුදල, තාවකාලිකව ගිණුමක රඳවා තැබිය යුතු අතර, චූදිත වැරදිකරු වූ පසු පමණක් එම මුදල් පාරිභෝගික ආරක්ෂණ අරමුදල් ගිණුමට මාරුකළ යුතුය. ඒ අනුව එම ක්‍රියාදාමය අනුගමනය කර ඇත. මෙහි සඳහන් කර ඇති රු. **1,246,064/-** මුදල් චූදිතයන් වරදකරුවන් බව උසාවිය නියම කිරීමෙන් පසු ආරක්ෂණ අරමුදල් ගිණුමට මාරු කර ඇත.

### 2.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සත්‍ය ගිණුම්වල පිරිවැය රු. **2,454,630/-**කි. එය සංයුක්ත වනුයේ,

| | |
|---|---|
| 1. ටෙන්ඩර මගින් ඉවත් කරන ලද වත්කම්වල පිරිවැය | රු. 2,442,859 |
| 2. නිලධාරීන් දෙදෙනෙකු වෙත භාරව තිබී අස්ථානගත වී ඇති ශබ්ද රෙකෝඩරය (රු.10,150) සහ නිලධාරී බෑගය (Brief Case) (රු. 1,621) (මෙම මුදල් අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අයකර ගන්නා ලදී) පිරිවැය | රු. 11,771 |
| ඒ අනුව අපහරණය කරන ලද වත්කම්වල සත්‍ය පිරිවැය | රු. 2,454,630 |

පාරිභෝගික අධිකාරිය විසින් සිදුකරනු ලබන වෙළඳපල වැටලීම් සහ දඩ මුදල් සම්බන්ධව ප්‍රගති සමාලෝචන කිරීම සඳහා එම අදාල කාලපරිච්ඡේදයට පවත්නා දල දත්තයන් උපයෝගී කරගෙන ප්‍රගති වාර්තා පිළියෙල කරනු ලබයි. මෙම ප්‍රගති වාර්තා හුදෙක් නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා අධිකාරියේ අභ්‍යන්තරව භාවිතය සඳහා යොදා ගනී. ඉහත ප්‍රගති වාර්තාවන්හි සඳහන් අඩුපාඩු සංශෝධනය කරමින් දඩ මුදල් සම්බන්ධව අවසන් වාර්තාව පිළියෙල කරනු ලබයි. ඒ අනුව මුදල් වාර්තා දෙකෙහි වෙනසක් තිබිය හැකිය.

## 2.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම</u>

**2010.10.25** සහ **2011.01.21** දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පාරිභෝගික අධිකාරිය සඳහා පර්යේෂණ ඒකකයක් පිහිටුවීමටත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීමටත් අනුමැතිය ලබාගෙන තිබුණි.

## 2.3.5 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම</u>

**1.** **2003** අංක **09** දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත

**(i)** **27** වන වගන්තිය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ **27** වන වගන්තිය අනුව වෙළෙඳුන් රු. **100,000/-** නොඉක්මවූ වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත අධිකාරියේ ලියාපදිංචි විය යුතු බවට සඳහන්ව ඇත. ඒ අනුව අධිකාරිය විසින් කීපවරක්ම වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සඳහා යෝජනාවලින් සකස්කර ගරු අමාත්‍යතුමන්ලා වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් මෙහිදී වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අයකිරීමේදී ඒ සඳහා ඔවුන් වෙත ලබා දෙන සේවාවන්හි ප්‍රමාණවත්භාවය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් මතුවිය. මෙම හේතුව නිසා **27** වන වගන්තිය අනුව වෙළෙන්දන් ලියාපදිංචිය මේ වනතෙක් සිදු කිරීමට අපහසු වී ඇත. එබැවින් මේ වන විට පනතේ මෙම වගන්තිය සංශෝධනය කිරීමටද පියවර ආරම්භ කර ඇත.

**(ii)** **3** වන වගන්තිය

අධිකාරියේ සාමාජිකයන් පත්කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයා සතු වන අතර ඔවුන්ට අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ඇත. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා ගරු අමාත්‍යවරයා දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**2.** **1971** අංක **38** දරන මුදල් පනත **(සී)** වගන්තිය

අධිකාරියේ සේවය කරන ලද අභ්‍යන්තර විගණනකවරිය සේවයෙන් ඉවත්ව යැමත් සහ ඉන්පසුව අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම මැතිවරණ වැනි විවිධ හේතු මත ප්‍රමාදවීම නිසාත් **2010** වර්ෂය තුල පූර්ණ අභ්‍යන්තර විගණයක් ක්‍රියාත්මක නොවීය. එහෙත් අභ්‍යන්තර විගණකවරයකු පත් කරගැනීම සඳහා **2010.09.24** දින පුවත්පත් දැන්වීම පලකරමින් **2011.01.04** දින සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වා තිබුණි. ඒ අනුව **2011.01.14** දින සිට අභ්‍යන්තර විගණනකවරයකු පත් කරන ලද අතර දැන් අභ්‍යන්තර විගණනයක් පාරිභෝගික අධිකාරිය තුළ ක්‍රියාත්මක කරනු ලැබේ.

**3.** **2003** ජුනි **02** දිනැති අංක පීඊඩී **12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

**(i)** **5.1.3** ඡේදය හා **5.2.1** ඡේදය

2011 -2013 කාල පරිච්ඡේදය සඳහා සකසන ලද සංයුක්ත සැලැස්මෙහි මෙම සියල්ල ඇතුලත් කරන ලදී.

(ii) 9.2 ඡේදය

2011-2013 සංයුක්ත සැලැස්මට එය ඇතුලත් කරන ලදී.

(iii) 9.10 ඡේදය

2011.05.19 හා DMS/E4/41/5/255/2 ලිපිය අනුව මේ සඳහා අනුමැතිය ලැබී ඇත. කෙසේ වෙතත් තවදුරටත් MA1-2 තනතුරු 6ටත් PL-3 තනතුරු 1 හා PL-1 තනතුරු 4ටත් අනුමැතිය ලබාගැනීමට අවශ්‍යව ඇත. මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යය පියවර දැනටමත් ගෙන ඇත.

(iv) 9.14.2 ඡේදය

අනුමැතිය ලබා ගැනීමට සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.

4. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 වගන්තිය

(අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ රාජකාරී ස්වරූපයන් අනුව නිදහස් කරන සමහර අත්තිකාරම් මුදල් කාර්යය කළ විගසම පියවීමේ අපහසුතාවයන් පවතී. කෙසේ වෙතත් මෙම අත්තිකාරම් මුදල් අදාල කාර්යය කළ පසු හා ඊට අදාල වාර්තා සහතික කිරීමෙන් පසුව පියවන අතර, විගණනය විසින් සඳහන් කර ඇති නොපියවූ අත්තිකාරම් ලේඛනයේ පහත සඳහන් අත්තිකාරම් 2 හැර අනෙක් අත්තිකාරම් සියල්ල මේ වන විට පියවා ඇත.

| | |
|---|---|
| එල්. නන්දසේන මහතා | 1000.00 |
| ඊ.එල්. ගුණරත්න මහතා | 4000.00 |

එල්. නන්දසේන සහ ඊ. එල්. ගුණරත්න යන නිලධාරීන් සේවයෙන් ඉවත්වූ නිලධාරීන් වන අතර, ඔවුන් ඉවත්වීමේදී නිශ්කාශන ලබාගෙන නොමැත. ඔවුන්ගෙන් අයවීමට ඇති අත්තිකාරම් මුදල් සඳහා සිහිකැඳවීම් ලිපි මේ වන විටත් යවා ඇත. කෙසේවෙතත් මෙම අත්තිකාරම් මෙම වර්ෂය තුලදී නොපියවන්නේ නම්,

එල්. නන්දසේන මහතා - නීතිමය ක්‍රියාමාර්ගයෙන් රු. 1000/- අයකර ගැනීම ප්‍රායෝගික නොවන බැවින් පොත්වලින් ඉවත් කිරීමටත්

ඊ.එල්. ගුණරත්න මහතා - නිවාඩු දින දීමනාවෙන් හිලව් කර ගැනීමටත්

5. අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් තවදුරටත් පාලනයක් ඇති කිරීමට ද අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට ද සඳහන් කර ගනිමි.

3. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

3.2 <u>සේවක මණ්ඩල කළමනාකරණය</u>

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන මුල් අවස්ථාවේ තිබූ අවශ්‍යතාවයන් අනුව ලබාගත් සේවක මණ්ඩල අනුමැතිය තුල ඇති සේවක වර්ගීකරණය හා වර්තමාන සත්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේදී විගණනය විසින් සඳහන් කරනු ලබන පුරප්පාඩු **168**ක් සහ අතිරික්ත සේවක සංඛ්‍යාව **107**ක් වේ. එහෙත් ආර්ථික, වෙළඳපළ හා අනෙකුත් සමාජයීය තත්ත්වයන් වෙනස් වීමත් සමඟ ප්‍රායෝගිකව අවශ්‍ය වූ සේවක සංයුතිය වෙනස් විය. ඒ අනුව ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රායෝගිකව අවශ්‍ය වූ සේවක මණ්ඩල සංයුතිය වෙනස් කරන ලදී. මේ සඳහා **2011.05.19** දින අංක **DMS/E4/41/255/2** ලිපිය අනුව, අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව දැන් අනුමත සේවක සංඛ්‍යාව තුල සේවක සංයුතිය ඇති අතර **2010.12.31** දිනට පුරප්පාඩු සේවක සංඛ්‍යාව **76** කි.

(ii) වාහන **08**ක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට අයත්ව තිබෙන අතර අමතරව සභාපතිතුමා සහ පූර්ණ කාලීන සාමාජිකයින් තිදෙනාද ඇතුළුව තවත් වාහන **4**ක් කුලීපදනම මත ලබා එම නිලධාරීන්ට අනුයුක්ත කර ඇත. ඒ අනුව වාහන ගණන **12**ක් වන අතර ඒ සඳහා අවශ්‍ය රියදුරු ගණන **12**කි. තවත් එක් රියදුරෙකු හදිසි අවශ්‍යතාවල කැඳවීම සඳහා රියදුරු සංචිතයේ තබා ඇත. එමෙන්ම ආයතනයේ අවශ්‍යතාවය මත තවත් වාහන ලබාදීමට මහා භාණ්ඩාගාරය මෙ වන විටත් අවශ්‍ය කටයුතු සිදුකර ඇති බැවින් දැනට සිටින රියදුරන් සංඛ්‍යාවද ඉදිරියේදී ප්‍රමාණවත් නොවන බවද සඳහන් කරමි.

(iii) පූර්ණ කාලීනව පුස්තකාලාධිපති හෝ සහකාර පුස්තකාලාධිපති තනතුරක් දැනට අධිකාරියේ පුස්තකාල කටයුතු සඳහා අවශ්‍යතාවයක් නොමැති බැවින් මෙම තනතුරු සඳහා බඳවා ගැනීම නොකරන ලදී. අදාල රාජකාරී සඳහා රාජකාරීන්, ලේඛන නිලධාරි නිලධාරිනියක් යටතේ රාජකාරීන් ලෙස සඳහන් කොට ඇත. සංශෝධිත බඳවා ගැනීම පරිපාටිය අනුමතවීමෙන් පසු මේ සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

(v) අධිකාරිය විසින් **2009.11.01** දින සරප් තනතුර සඳහා නිලධාරියකු බඳවා ගෙන තිබුණි.

(vi) අධිකාරියේ ක්‍රියාකාරී ස්වභාවය අනුව පරිවර්තකයෙකු බඳවාගන්නේ නම් එම නිලධාරියා දිවුරුම් පරිවර්තකයෙක් **(Swomed Translator)** විය යුතුය. පවතින වැටුප් ව්‍යුහයන් අනුව මෙවැනි නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැක. ඒ අනුව මෙම සේවාව සුදුසුකම්ලත් අයගෙන් ලබාගෙන ඇත. බඳවා ගැනීම ප්‍රායෝගික නොවන බැවින් නව බඳවා ගැනීම පරිපාටියට ද පරිවර්තක තනතුර ඇතුලත් නොකරන ලදී.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් තවදුරටත් අධ්‍යයනය කර මෙම තනතුර ප්‍රායෝගික අවශ්‍යතාව බඳවාගැනීමට අවශ්‍ය සියළුම කටයුතු ඉදිරියේදී කරනු ඇත.

(vii) 2010 සැප්තැම්බර් 28 දින සිට තවත් වසරක සේවය දීර්ඝ කර ලේකම්තුමා විසින් අනුමැතිය දී ඇත.

(ආ) දැනට කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ රාජකාරී කටයුතු කරනු ලබන්නේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව පිහිටුවා ඇති කාර්යාලය මගිනි. කුරුණෑගල දිස්ත්‍රික්කය භෞතිකව විශාල දිස්ත්‍රික්කයක් වන බැවින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආශ්‍රිතව සිදු කරන වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොදවා ගෙන තිබුණි. කෙසේ වෙතත් විධිමත් අනුමැතියක් ලබාගන්නා තෙක් මෙම නිලධාරීන් දැන් ප්‍රධාන කාර්යාලය, කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත හා පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය වෙත අනුයුක්ත කරන ලදී.

## 3.3 <u>අවිනිශ්චිත ස්වභාවයේ ගනුදෙනු</u>

(අ) <u>කුරුණෑගල දිස්ත්‍රික් ගොඩනැගිල්ල</u>

මෙම නව ගොඩනැගිල්ල තුල 2011 වර්ෂයේ සිට කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන ගිය අතර එහි ඉහත මාලයේ ඉදිකිරීම් කටයුතු කිරීමට අවශ්‍ය බැවි දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් දැනුම්දීමෙන් පසු නැවතත් තාවකාලිකව, එම ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක්, කුරුණෑගල කාර්යාලය පවත්වාගෙන ගිය පෙර ගොඩනැගිල්ලටම ගෙන යන ලදී. ඒ අනුව මෙය තාවකාලිකව දිසාපතිතුමියගේ ඉල්ලීම මත සිදු කරනු ලැබූ ක්‍රියා මාර්ගයකි.

(ආ) <u>මාධ්‍ය ඒකකයක් පිහිටුවීම</u>

(I) අධිකාරියේ කටයුතු වේගවත්ව ලංකාව පුරා ව්‍යාප්ත කිරීමේ කාර්යයත් සමඟම මාධ්‍ය ඒකකයක් පිහිටුවීම අත්‍යාවශ්‍ය කටයුත්තක් විය. මේ සඳහා වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කරන ලෙස දන්වා තිබුණි. ඒ අනුව මාධ්‍ය ඒකකය සඳහා අවශ්‍ය නිලධාරීන් සඳහා විධිමත් අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා තෙක්, මෙහි කටයුතු කරගෙන යාම සඳහා කොන්ත්‍රාත් පදනම මත මෙම නිලධාරියා බඳවා ගන්නා ලදී.

(II) මෙම ඒකකය මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සිදු කරන කාර්යයන් (වෙළඳපල විමර්ශන, නඩු පැවරීම්, පාරිභෝගික සහ වෙළෙඳ අධ්‍යාපන වැඩ මුළු සහ ප්‍රදර්ශන) සඳහා මාධ්‍ය ආවරණය සහ ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබයි. මෙම කාර්ය භාරයන් බොහොමයක් ගරු අමාත්‍යතුමන්ගේ නිරන්තර අධීක්ෂණයටද ලක්වන අතර වරින් වර අමාත්‍යතුමන් විසින් ඉහත කටයුතු නිරීක්ෂණය කිරීමද සිදුවේ.

මෙම ඒකකය මගින් ඉටු කරනු ලබන ඉහත කාර්ය භාරය සැලකිල්ලට ගත්කල එය සංචිත වාහනයක කාර්ය භාරය ඉටුකරයි. ඒ අනුව, අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබා දී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ඇත.

(III) මෙම නිලධාරියාගේ රාජකාරී ස්වරූපය අනුව, ඔහුට සෙනසුරාදා, ඉරිදා සහ අනෙකුත් නිවාඩු දිනයන්හිදී වුවද සේවයේ නියුක්තවීමට සිදුවේ. මෙම හේතුව මත උපරිම නිවාඩු දින 5ක් සඳහා 1/20 දීමනා ලබාදීමට තීරණය අමාත්‍යාංශ ලේකම්තුමා විසින් අනුමැතිය ලබාදී ඇත.

මෙසේ අතිකාල දීමනා ප්‍රමාණය ඉහළ යෑමට හේතුවන්නේ මාධ්‍ය ඒකකයේ රාජකාරිවලට අමතරව ඉලක්කගත වැටලීම් ලභාකර ගැනීමේ අරමුණ ඇතිව අධිකාරිය වැටලීම් ප්‍රමාණය ඉතා සීඝ්‍ර ලෙස වැඩි කිරීමයි. මෙසේ වැටලීම් ප්‍රමාණය ඉහළ යෑමත් සමඟම ඒ සඳහා මාධ්‍ය ආවරණය කිරීම සඳහා ලංකාව පුරා යෑමට සිදුවේ. එමෙන්ම මෙහි සඳහන් එක් රියදුරෙකු නුවරඑළිය දිස්ත්‍රික්කයට සම්බන්ධව වැටලීම් රාජකාරීවල නියුක්ත වූ රියදුරු වශයෙන්ද සේවය කරන ලදී. ඒ අනුව මෙම රියදුරන් සෙනසුරාදා / ඉරිදා දින හා අනෙකුත් රජයේ නිවාඩු දිනයන්වල මෙන්ම රාජකාරී වේලාවට අමතරව සේවයේ යෙදවීමට සිදුවේ. අධිකාරිය ලබාදුන් වැටලීම් ඉලක්කවල ඉහළින්ම (170% වැඩි) සිටින දිස්ත්‍රික්කය වන්නේ නුවරඑළිය බව වැඩිදුරටත් සඳහන් කරමි.

ඊට අමතරව ඉහත සඳහන් ආකාරයට මෙම මාධ්‍ය කටයුතුවල කොටසක් ගරු අමාත්‍යතුමාගේ රාජකාරී වෙනුවෙන්ද කර ඇත. මේ සඳහා වන වියදම්වලින් කොටසක් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට ඉල්ලීමක් ද කර ඇත.

(ඇ) <u>වැටුප ඉක්මවා අතිකාල දීමනා ගෙවීම</u>

අතිකාල ගෙවීම පාලනය කිරීම සඳහා මේ වන විට අවශ්‍ය සැලසුම් සකස් කරමින් සිටින අතර දැනටමත් අතිකාල ගෙවීම සීමාකර ඇත. විශේෂයෙන් සංචිත වාහන රියදුරන් සඳහා (පවත්නා චක්‍ර ලේඛනය අනුව) අතිකාල සීමාවක් නොමැති වීම මේ සඳහා හේතුවී තිබුණි. මේ සඳහා සීමාවක් පැනවීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

(ඈ) <u>කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා ආපදා ණය ගෙවීම</u>

කිසිම කොන්ත්‍රාත් සේවකයෙක් සඳහා ආපදා ණය ගෙවා නොතිබුණි.

(ඉ) මෙය අවස්ථානුකූලව සිදුකරනු ලැබූ වියදමකි. මෙම වියදම රේඛීය අමාත්‍යාංශයෙන් නැවත ගෙවීමට එකඟවිණි. ඒ අනුව ඉදිරියේදී මෙම මුදල් අමාත්‍යාංශය හරහා අයකරගත හැක.

4. <u>පද්ධති හා පාලන</u>

ඔබ විසින් සඳහන් කර ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධ විශේෂ අවධානයක් යොමු කර උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කිරීමට සඳහන් කර ගනිමු.

රු[illegible]ක්
සභාපති